ශ්‍රී ලංකා කජු සංස්ථාව
இலங்கை மரமுந்திரிகை கூட்டுத்தாபனம்
SRI LANKA CASHEW CORPORATION

වාර්ෂික වාර්තාව සහ ගිණුම්
வருடாந்த கணக்கும் அறிக்கையும்
ANNUAL REPORT AND ACCOUNTS

2017

පටුන		පිටු අංක
1.	සභාපතිවරයාගේ වාර්තාව	01-22
	• සංස්ථාවේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ පරමාර්ථ	
	• අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යේෂ්ඨ කළමනාකරණය පිළිබඳ කෙටි හැඳින්වීම	
2.	අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	23-27
3.	විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව	28-31
4.	කාර්ය සාධන වාර්තාව	32-35
5.	කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග	36-43
6.	කාර්ය සාධනය පිළිබඳ වර්ෂ 05 ක සාරාංශය	44-45
7.	විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන	46-63
8.	1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව	64-74
9.	විගණන වාර්තාවල සඳහන් අඩුපාඩු නිවැරදි කරගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග	75-83
10.	වර්ෂ 5 ක ගිණුම් සාරාංශය	84

ශ්‍රී ලංකා කජු සංස්ථාව

2017 වර්ෂය සඳහා සභාපතිගේ වාර්තාව

(01) ශ්‍රී ලංකා කජු සංස්ථාව ස්ථාපනය

ශ්‍රී ලංකා කජු සංස්ථාව 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1973 මැයි මස 25 වන දින අංක 60/7 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවන ලදී. සංස්ථාව ආරම්භයේ සිට රාජ්‍ය ව්‍යාපාරයක් වශයෙන් ක්‍රියාත්මක වන අතර, කජු කර්මාන්තය සඳහා සියළුම සේවාවන් සැපයීම සිදුකරන අතරතුර වාණිජ කටයුතුද ලාභදායි මට්ටමකින් සිදුකරයි.

- **දැක්ම**

ඉතාමත් උසස් තත්වයේ කජු නිෂ්පාදනය කිරීම තුලින් ශ්‍රී ලංකාව ලෝකයේ කජු අපනයනය කරන ප්‍රමුඛතම රටක් බවට පත් කිරීම.

- **මෙහෙවර**

කජු වගාව, නිෂ්පාදනය, පිරිසැකසුම් තාක්ෂණය, අගය එකතු කිරීම, පර්යේෂණ හා අලෙවි ප්‍රවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ගොවීන් සහ අදාල පාර්ශවයන් වෙත වෘත්තියමය මග පෙන්වීම ලබාදීම තුලින් දිගුකාලීන වූ වාණිජමය ශක්‍යතාවයක් ලහාකර ගැනීමට හැකිවන පරිදි කජු කර්මාන්තය නගාසිටුවීම.

__ඉලක්ක__

- වගාව ව්‍යාප්ත කිරීම මගින් අස්වැන්න ඉහළ නැංවීම
- කජු පිරිසැකසුම් කර්මාන්තයේ හා වතුයායන්වල ඵලදායිතාවය ඉහළ නැංවීම.
- ශ්‍රී ලංකාවේ කජු සඳහා ගෝලීයව පිලිගත් වෙළඳනාමයක් ඇතිකිරීම.
- අගය එකතු කිරීම හා නව නිෂ්පාදන සංවර්ධනය
- කජු අපනයනය දිරිගැන්වීම.
- ශ්‍රී ලංකාව කජු නිෂ්පාදනයේ ප්‍රමුඛයා බවට පත්වීම.
- ලාභ ඉපයිම මගින් ස්වයංපෝෂිත රාජ්‍ය සංස්ථාවක් බවට පත්වීම.

__අරමුණු__

(අ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.

(ආ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය, පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ කටයුතු සිදු කිරීම.

(ඇ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම දියුණු කිරීමේ පරමාර්ථයෙන් විමර්ශන හා පර්යේෂණ කටයුතු සිදුකිරීම.

(ඈ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ තාක්ෂණික. අලෙවි හා වෙනත් තොරතුරු රැස් කිරීම, පිළියෙල කිරීම, ප්‍රසිද්ධ කිරීම සහ බෙදා හැරීම සහ ඒ කටයුතු වලදී අන් අය සමඟ එක්ව ක්‍රියා කිරීම.

(ඉ) කජු සහ කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා පිහිටුවනු ලබන කර්මාන්තශාලා පිහිටුවිය යුතු ස්ථාන, ඒවායේ ප්‍රමාණය හා තාක්ෂණික ප්‍රමිති නිශ්චය කිරීම සහ අළුත් කර්මාන්තශාලා පිහිටුවීමටත් අවශ්‍ය අවස්ථාවලදී එවකට පවතින කර්මාන්තශාලා ක්‍රියා කරවීම.

(ඊ) කජු සහ කජු නිෂ්පාදන මිලට ගැනීම, බෙදා හැරීම, විකිණීම සහ අපනයනය කිරීම.

(උ) කජු වගා කිරීම පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම පිළිබඳ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම පිණිස පහසුකම් සැපයීම.

(ඌ) කජු වගාවන්, පිරිසැකසුම් කිරීමේ පහසුකම් සහ අළෙවි කිරීම දියුණු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය මූලික සංවිධානය පිහිටුවීම සහ ඒවා පිහිටුවීමට ආධාරදීම.

(එ) කජු නිෂ්පාදන ප්‍රචාරය කිරීම හා විකිණීම සඳහා අවශ්‍යයැයි සලකනු ලබන පියවර ගැනීම, ලෝකයේ වෙළඳපොලවල්වල ඒ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම සහ ඒ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාර්යයන් සඳහා ප්‍රචාරක කටයුතුවලට මුදල් යෙදවීම, ඒ කටයුතු අනුපාලනය කිරීම සහ ඒ කටයුතු වලට ආධාරදීම ආරම්භ කොට ඊට අනුග්‍රහ දැක්වීම.

(02) **ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය -2017**

(2.1) 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජිකයන්

i)	**ඩී.බී.කරුණාරත්න මහතා**	**-**	**සභාපති**
ii)	එම්.ඩබ්.එම්.බණ්ඩාරතිලක මහතා	-	නියෝජ්‍ය සභාපති
iii)	ඒ.ඒ.ඩී.එස්. අතපත්තු මහත්මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මහා භාණ්ඩාගාර නියෝජිත)
iv)	එම්.ආර්.එම්.අයි.රීසා මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
v)	වී.මංචනායක මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
vi)	කේ.ලිංගරාජා මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
vii)	ඒ.එස්.එම්.ෆස්මි මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2017 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් - කීර්ති ජයකොඩිආරච්චි මහතා (සාමාන්‍යාධිකාරී)

(2.2) **ශ්‍රී ලංකා කජු සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුව -2017**

i)	ඒ.ඒ.ඩී.එස් අතපත්තු මහත්මිය	-	කමිටු සභාපතිනී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - මහා භාණ්ඩාගාර නියෝජිත
ii)	වී.මංචනායක මහතා	-	කමිටු සාමාජික අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
iii)	එම්.ආර්.එම්.අයි.රීසා මහතා	-	කමිටු සාමාජික අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
iv)	ඩී.කේ. ජයකොඩිආරච්චි මහතා	-	කමිටු ලේකම් සාමාන්‍යාධිකාරී
v)	වී.යු. ලියනගේ මහතා	-	කමිටු සාමාජික සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන
vi)	ඩී.ජී.එච්.ඩී.පෙරේරා මහතා	-	කමිටු නිරීක්ෂක ප්‍රධාන අභ්‍යන්තර විගණක (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය)- 2017.10.20 දින සිට
vii)	ආර්.පී.එස් පද්මිණී මහත්මිය	-	කමිටු නිරීක්ෂක විගණන අධිකාරී (විගණකාධිපති දෙපාර්තමේන්තුව)

(2.3) **ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ඉහල කළමනාකරණය -2017**

i) ඩී.කේ. ජයකොඩිආරච්චි මහතා - සාමාන්‍යාධිකාරී

ii) පී.බී. කොඩිකාර මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

(2.4) **ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මධ්‍යම කළමනාකරණ කාර්යය මණ්ඩලය**

i) එම්.ටී.එස්.කේ. පීරිස් මහතා - සහකාර සාමාන්‍යාධිකාරී -මුදල්

ii) ජී.බී.බී. සුරේන්ද්‍ර මහතා - සහකාර සාමාන්‍යාධිකාරී -ව්‍යාප්ති හා පර්යේෂණ

iii) වී.යු. ලියනගේ මහතා - සහකාර සාමාන්‍යාධිකාරී අභ්‍යන්තර විගණන

iv) ආර්.එම්.පී. ජයතිස්ස මහතා - සහකාර සාමාන්‍යාධිකාරී අලෙවි හා පිරිසැකසුම්

vi) පී.එම්.ඒ.පී.කේ. විජේතුංග මහතා- සහකාර සාමාන්‍යාධිකාරී -වැවිලි

(2.5) <u>ලියාපදිංචි කාර්යාල</u>

ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල

ප්‍රධාන කාර්යාලය

ශ්‍රී ලංකා කජු සංස්ථාව, අංක 1334, පරණ කෝට්ටේ පාර, රාජගිරිය

දුරකථන

සභාපති	-	0112-871005	ෆැක්ස්	-	0112-867843
නියෝජ්‍ය සභාපති	-	0112-869844	ඊ මේල්	-	cashewco@dialogsl.net
සාමාන්‍යාධිකාරී	-	0112-876134	වෙබ්	-	www.cashew.lk

ප්‍රාදේශීය කාර්යාල, වතුයායන්, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන මධ්‍යස්ථාන හා පිරිසැකසුම් ඒකක

(2.6) <u>ප්‍රාදේශීය කාර්යාල</u> <u>ආවරණය වන දිස්ත්‍රික්ක</u>

1. පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය - පුත්තලම/ කුරුණෑගල
2. හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලය- හම්බන්තොට/රත්නපුර

3. අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය - අනුරාධපුරය
4. නාලන්ද ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ/පොළොන්නරුව
5. මොණරාගල ප්‍රාදේශීය කාර්යාලය - මොණරාගල
6. මහියංගණය ප්‍රාදේශීය කාර්යාලය - මහනුවර/බදුල්ල
7. අම්පාර ප්‍රාදේශීය කාර්යාලය - අම්පාර
8. මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය - මඩකලපුව/ත්‍රිකුණාමලය
9. කිලිනොච්චි ප්‍රාදේශීය කාර්යාලය - කිලිනොච්චි/මුලතිව්/යාපනය
10. මන්නාරම ප්‍රාදේශීය කාර්යාලය - වවුනියා/මන්නාරම

(2.7)

වතුයායන්	පිහිටි දිස්ත්‍රික්කය	මුළු අක්කර ප්‍රමාණය	වගාකර ඇති අක්කර ප්‍රමාණය
1. කමන්දළුව වතුයාය	පුත්තලම	548	548
2. ආච්චිගේවත්ත වතුයාය	පුත්තලම	961	510 (අක්කර 250 ක ප්‍රමාණයක් වගාව සඳහා සුදුසු නැත)
3. එළුවන්කුලම වතුයාය	පුත්තලම	209	198.4 (අක්කර 10.6 ක ප්‍රමාණයක් සුදුසු නැත)
4. හාඩි වතුයාය	මඩකලපුව	343	194 (අක්කර 149 ක ප්‍රමාණයක් වගාව සඳහා සුදුසු නැත)
5. විලච්චිය වතුයාය	අනුරාධපුර	25	17 (අක්කර 08 ක ප්‍රමාණයක් වගාව සඳහා සුදුසු නැත)
6. නාලන්ද වතුයාය	මාතලේ	75	50 (අක්කර 25 ක ප්‍රමාණයක් වගාව සඳහා සුදුසු නැත)

(2.8)

බීජ උද්‍යාන	පිහිටි දිස්ත්‍රික්කය	මුළු අක්කර ප්‍රමාණය	වගාකර ඇති අක්කර ප්‍රමාණය
1. මහඔය බීජ උද්‍යානය	අම්පාර	81	53 (අක්කර 28 ක ප්‍රමාණයක් වගාව සඳහා සුදුසු නැත)
2. සුදුවතුර ආර බීජ උද්‍යානය	මොණරාගල	50	21 (අක්කර 29 ක ප්‍රමාණයක් වගාව සඳහා සුදුසු නැත)

3. ඔයාමඩුව බීජ උද්‍යානය	අනුරාධපුර	250	80 (අක්කර 170 ක ප්‍රමාණයක් වගාව සඳහා සුදුසු නැත)
4. කොණ්ඩච්චි බීජ උද්‍යානය	මන්නාරම	6000	1450 (අක්කර 4000ක් සඳහා P.P.P ව්‍යාපෘතියක් යෝජනා වී ඇත)
5. තිරියාය බීජ උද්‍යානය	ත්‍රිකුණාමලය	50	05 (ඉඩම නිදහස්කර ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.)
6. මාන්කර්ණි බීජ උද්‍යානය	මඩකලපුව	100	70 (අක්කර 30 ක ප්‍රමාණයක් වගාවසඳහා සුදුසු නැත

(2.9)

මධ්‍යම පැළ තවාන්	ආවරණය වන දිස්ත්‍රික්ක	පැළ නිෂ්පාදන ධාරිතාවය (අක්කර)	පැළ ගණන
1. මිහින්තලේ පැළ තවාන	අනුරාධපුර/වව්නියා/මන්නාරම/කිලිනොච්චි/මුලතිව්	2.5	120000
2. දඹුල්ල පැළ තවාන	මාතලේ/පොළොන්නරුව	3.0	25000
3. කමන්දළුව පැළ තවාන	පුත්තලම/කුරුණෑගල	1.0	150000
4. හාඩි පැළ තවාන	මඩකලපුව/ත්‍රිකුණාමලය	1.0	10000
5. කුඹුක්කන පැළ තවාන	මොණරාගල	3.0	50000
6. අළුත්තරම පැළ තවාන	බදුල්ල/මහනුවර	2.0	50000
7. චන්ද්‍රිකාවැව පැළ තවාන	හම්බන්තොට/රත්නපුර	0.5	20000

(2.10) <u>කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන</u> <u>දිස්ත්‍රික්කය</u>

1. නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය - ගම්පහ
2. පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානය - පුත්තලම

(2.11) <u>පර්යේෂණ ඒකක</u> <u>දිස්ත්‍රික්කය</u>

1. කමන්දළුව පර්යේෂණ ඒකකය - පුත්තලම
2. පුත්තලම පර්යේෂණ ඒකකය - පුත්තලම

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රධාන ඒකාබද්ධ පර්යේෂණ සහයෝගීතාවය

වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිළි කලමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

(2.12) **සංස්ථා කජු අලෙවිසැල්** **දිස්ත්‍රික්කය**

1.	අංක 1334, පරණ කෝට්ටේ පාර, රාජගිරිය	-	කොළඹ
2.	අංක 518, ගාලු පාර, කොළඹ 03	-	කොළඹ
3.	පින්නවල අලි අනාථාගාර පරිශ්‍රය	-	කෑගල්ල

(2.13) **සංස්ථා වරලත් කජු අලෙවිසැල් පිහිටා ඇති ස්ථාන**

1. රන්දිය ෆෘට්ස් ඇන්ඩ් නට්ස් , පයාගල, මග්ගොන.
2. සුනිලා ග්‍රොසරි, අංක 35, අළුත් පාර, අම්බලන්ගොඩ.
3. P & J සිටි, ගාමිණී මාවත, ගාල්ල.
4. ෆ්‍රෙෂ් ෆාම් ෂොප්, ගාළු පාර, හික්කඩුව.
5. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, නාරාහේන්පිට.
6. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, වැලිසර.
7. Ranjanas 7 Stories, අංක 318, ගාළු පාර, කොලඹ 04.
8. ආනන්ද ෆුඩ් සිටි, අංක 272, අඟුරුවාතොට පාර, හොරණ.
9. පානදුර කෝප් සිටි, සී/ස පානදුර විවිධ සේවා සමුපකාර සමිතිය, ජනප්‍රිය මාවත, පානදුර.
10. නිව් ඇමරිකන් චිකන් හට්, 16, ශ්‍රී සාරානන්ද මාවත, කළුතර.
11. සම්පත් ෆාමසි ඇන්ඩ් ග්‍රොසරි, 39E, මාතර පාර, අකුරැස්ස.
12. සියුම් ෆුඩ් ප්‍රඩක්ට්ස්, අංක 499, කෙලින් විදිය, කෑගල්ල.
13. සීමාසහිත යටිනුවර ගඟපලාත විවිධ සේවා සමුපකාර සමිතිය, පොල්ගහමුල හන්දිය, පේරාදෙණිය.
14. සීමාසහිත යටිනුවර මැදපලාත විවිධ සේවා සමුපකාර සමිතිය, ඇඹිල්මීගම, පිළිමතලාව.

15. සීමාසහිත මධ්‍යම පලාත් සමූපකාර සමිතිය, ඇහැලේපොල කුමාරිහාමි මාවත, බෝගම්බර, මහනුවර.
16. සීමාසහත පූජාපිටිය සමූපකාර සමිතිය, පූජාපිටිය.
17. සීමාසහිත හාරිස්පත්තුව උතුර විවිධ සේවා සමූපකාර සමිතිය, මාතලේ පාර අලවතුගොඩ.
18. සීමාසහිත කුණ්ඩසාලේ විවිධ සේවා සමූපකාර සමිතිය, මැණික්හින්න.
19. සිමාසහිත මහනුවර විවිධ සේවා සමූපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, පල්ලෙකැලේ.
20. සිමාසහිත මහනුවර විවිධ සේවා සමූපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, මාතලේ.
21. සිමාසහිත මහනුවර විවිධ සේවා සමූපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, ලග්ගල.
22. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාරය, අංක 21, ගාළු පාර, දෙහිවල.
23. උදම්සා කිරිහල, 978 D 3, පන්නිපිටිය පාර, පැලවත්ත.
24. තල් සංවර්ධන මණ්ඩලය, ගාළු පාර, බම්බලපිටිය.
25. තල් සංවර්ධන මණ්ඩලය, කන්කසන්තුරේ පාර, යාපනය.
26. තල් සංවර්ධන මණ්ඩලය, නල්ලූර් කෝවිල අසල, යාපනය.
27. තල් සංවර්ධන මණ්ඩලය, රෝහල පාර, යාපනය.
28. තල් සංවර්ධන මණ්ඩලය, ප්‍රධාන වීදිය, වවුනියාව.
29. ඔන් රෝ ෆාමසි, නො. 25, නාගොඩ පාර, කටුකුරුන්ද.
30. ගෝල්ඩන් මේඩ්, 144, ගාළු පාර, අහංගම.
31. නිව් මෝනිස් බේකරි, ගාළු පාර, මග්ගොන.
32. කැන්ඩි ලයින්ස්, පාර්ක් රෝඩ්, කෑගල්ල.
33. සාගර බේකර්ස්, අඟුරුවාතොට පාර, හොරණ.
34. රෝයි ග්‍රොසරි, මතුගම පාර, කටුකුරුන්ද හන්දිය, කළුතර.
35. හරිස්චන්ද්‍ර මිල්ස්, ටැල්බට් වීදිය, ගාල්ල.
36. ජේ.එෆ්. ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස්, ජාවත්ත පාර, බම්බලපිටිය.
37. Colombo Cricket Club, මේට්ලන්ඩ් චන්ද්‍රවංකය, කොළඹ 07.

38. EPPCO Mini Mart, ප්‍රධාන පාර, මාවනැල්ල.
39. ලයන් ග්‍රොසරි, මාකුඹුර, පන්නිපිටිය පාර, කොට්ටාව.
40. DGM Agriculture Dept., මාතර.
41. අබේගුණවර්ධන ස්ටෝර්ස්, දෙනියාය.
42. තලගල ස්ටෝර්ස්, තලගල.
43. කෝප් සිටි, කුණ්ඩසාලේ.
44. සෙප්කෝ සුපර්, බෝගම්බර.
45. DGM Agriculture Dept., ගාල්ල.
46. පැනොරාමා චයිනීස් රෙස්ටුරන්ට්, කොට්ටාව.
47. Namunukula Dairy Stores, වත්තල.
48. මාස්ටර් ෂොපර්, කොළඹ 01.
49. රුහුණු රසාර,මාතර.
50. රුහුණු රසාර, ලබුදුව.
51. රෝයල් බේකරි , වැල්ලවත්ත.
52. ඉන්ද්‍රා වයින් ස්ටෝර්ස්, හික්කඩුව.
53. කපුවත්ත මහත්මිය, නාවල, රාජගිරිය.
54. විවිධ සේවා සමුපකාර සමිතිය-මහනුවර.
55. අග්‍රාමාත්‍ය කාර්යාලය, කොළඹ.

(2.14) <u>සංචාරක බංගලා</u> <u>දිස්ත්‍රික්කය</u>

1.	පුත්තලම සංචාරක බංගලාව	-	පුත්තලම
2.	හාඩි සංචාරක බංගලාව	-	මඩකලපුව

(03) <u>සංස්ථාවේ සංවර්ධන කාර්යයන්</u>

ශ්‍රී ලංකා කපු සංස්ථාවේ සංවර්ධන කාර්යයන් ඉටුකිරීම සඳහා සංස්ථාව ප්‍රධාන වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කරයි.

1. **ව්‍යාප්ති සහනාධාර වැඩසටහන**
2. **වතු සංවර්ධනය, පුනරුත්ථාපනය හා ඵලදායිතාවය වර්ධනය කිරීම**
3. **අලෙවි සහ පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය**
4. **පර්යේෂණ සහ සංවර්ධනය**

(3.1) <u>ව්‍යාප්ති සහනාධාර වැඩසටහන</u>

(3.1.1) ශ්‍රී ලංකාවේ කජු වගාවේ සංයුතිය



වෙනත් ව්‍යාපෘති

* **දි.ආ.ව.ඒ** - 'දිවි නැගුම' ආර්ථික වගා ඒකක
* **දි.ආ.දි.ප්‍ර.න** - දිළිඳු ජනතාවගේ ආර්ථිකය දියුණු කිරීමේ හා ප්‍රජාව නගා සිටුවීමේ ව්‍යාපෘති
***ප්‍රා.ආ. ස.වැ** - ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන වැඩසටහන - මාතලේ දිස්ත්‍රික්කය
***උ.ගැ.පු.දෙ** - උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ ව්‍යාපෘතිය

(3.1.2) <u>කජු වගාව ව්‍යාප්ත කිරීම හා ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම</u>

(3.1.2.1) වගා වපසරිය වැඩිකිරීම

2017 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත සමස්ත කජු වගා භූමි ප්‍රමාණය අක්කර 150108 කි. 2017 වර්ෂයේදී දිස්ත්‍රික්ක 19 ක සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 125 ක් ආවරණය වන පරිදි බද්ධ කජු අක්කර 2363 ක් හා බීජ කජු අක්කර 2137 ක් වගා කරන ලද අතර මෙම සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ගෙවතු වගාව යටතේ අක්කර 1285 ක් සඳහා පැළ ලබාදෙන ලදී. මෙම සහනාධාර වැඩසටහන යටතේ පවුල් 14932 ක් සඳහා ප්‍රතිලාභ ලබාදී ඇත.

කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය

දිස්ත්‍රික්කය	බද්ධ කජු (අක්කර)	බීජ කජු (අක්කර)	ගෙවතු වගාව	
			බද්ධ කජු (අක්කර)	බීජ කජු (අක්කර)
1.පුත්තලම	270	95	55	30
2.කුරුනෑගල	205	45	95	30
3.හම්බන්තොට	55	60	55	65
4.අනුරාධපුර	265	20	115	-
5.අම්පාර	-	335	83	07
6.බදුල්ල	25	25	-	-
7.මහනුවර	125	25	-	-
8.රත්නපුර	10	10	10	10
9.මාතලේ	150	-	25	-
10.පොළොන්නරුව	140	-	10	-
11.මොණරාගල	200	50	20	05
12.මඩකලපුව	25	200	25	150
13.ත්‍රිකුණාමලය	15	100	10	125
14.වවුනියාව	50	150	25	50
15.මන්නාරම	25	100	50	75
16.මුලතිව්	75	160	-	40
17.කිළිනොච්චි	50	80	-	40
18.යාපනය	-	25	-	30
19.කෑගල්ල	50	-	50	-
එකතුව	**1735**	**1480**	**628**	**657**

(3.1.2.2) කජු වගා සහනාධාර වැඩසටහන යටතේ ගොවීන්ට ප්‍රතිලාභ ලබාදීම

බද්ධ කජු වගාකිරීම සඳහා අක්කරයකට රු 9,500/- ක මුදලක් සහ බීජ කජු වගාකිරීම සඳහා අක්කරයකට රු 3,500/- ක් වශයෙන් මෙම සහනාධාර වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන්කර ඇත. එසේ වුවද, මෙම වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් මෙම කාර්යය සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවේ. වර්තමානයේදී සහනාධාර වැඩසටහන යටතේ තෝරාගත් ගොවීන්හට ගොවි පුහුණුව සහ තාක්ෂණය ලබාදීම ඇතුළු අනෙකුත් ව්‍යාප්ති සේවාවන් නොමිලයේ ලබාදෙන අතර, වගාභූමි ප්‍රමාණයට අවශ්‍ය බද්ධ කජු පැළ සහ බීජ කජු පැළ නොමිලයේ ලබාදීම සිදුකරනු ලබයි. මෙම කටයුතු සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල 10 ක් හරහා කජු වගාකරනු ලබන දිස්ත්‍රික්ක 19 ක් මගින් සිදුකරනු ලබයි.

(3.1.2.3) ව්‍යාප්ති සේවා පුළුල් කිරීම

උතුරු ප්‍රදේශයට තවදුරටත් ව්‍යාප්ති සේවා පුළුල් කිරීමේ අරමුණින් මන්නාරම් දිස්ත්‍රික්කය සඳහා ප්‍රාදේශීය කාර්යාලයක් ස්ථාපනය කරන ලද අතර, එමඟින් මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්ක ආවරණය කරනු ලබයි.

(3.2) වතු සංවර්ධනය, පුනරුත්ථාපනය හා ඵලදායිතාවය වර්ධනය කිරීම

(3.2.1) කජු වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම

(3.2.1.1) රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

සංස්ථාවේ කජු රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන මධ්‍යස්ථානවල ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය යටතේ (GAP) උසස් නිෂ්පාදන තත්ත්වයන් පවත්වා ගනිමින් මව්බීජ 560000 ක් නිෂ්පාදනය කරන ලදී. බද්ධ පැළ හා බීජ පැළ නිෂ්පාදනය කිරීමේදී එම මව්බීජ හා මව්ගස් වලින් ලබාගත් රිකිළි 200000 ක ප්‍රමාණයක් භාවිතා කරන ලදී.

(3.2.1.2) තවාන් කලමනාකරණය

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් වලින් ඉහළ ගුණාත්මයෙන් යුතු නව ප්‍රභේද වලින් සමන්විත බද්ධ පැළ 328456 ක් නිෂ්පදනය කර, සහනාධාර වැඩසටහන සඳහා සහ පෞද්ගලික වතු හිමියන් සඳහා නිකුත් කරන ලදී.

2017 වර්ෂයේ බද්ධ පැළ නිෂ්පාදනය

පැළ තවානේ නම	නිපදවන ලද බද්ධ පැළ
1. කමන්දළුව	134655
2. දඹුල්ල	24976
3. මිහින්තලේ	104924
4. අළුත්තරම	23634
5. කුඹුක්කන	14950
6. හාඩි	6846
7. චන්ද්‍රිකා වැව	18471
එකතුව	**328456**

සහනාධාර යෝජනා ක්‍රමයට අවශ්‍ය බීජ පැළ 105480 ක් නිපදවීම සඳහා මඩකලපුව, ත්‍රිකුණාමලය, වවුනියා, මන්නාරම, මුලතිව්, කිළිනොච්චි, යාපනය, අම්පාර, පුත්තලම, කුරුණෑගල, හම්බන්තොට හා බදුල්ල දිස්ත්‍රික්කවල පැළ තවාන් 60 ක් ස්ථාපනය කරන ලදී.

(3.2.1.3) වතුයායන්වල නව වගාව

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පුත්තලම, කමන්දළුව, එළුවන්කුලම, හාඩි, ඔයාමඩුව, මාන්කර්ණි, මඩකලපුව යන වතුයායන්වල විශාල වශයෙන් සංවර්ධන කටයුතු සිදුකල අතර, 2017 වර්ෂය තුළ පුත්තලම ආච්චිගේ වතුයායේ පැවති පැරණි ගස් ඉවත්කර රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද අතුරු බෝග වගා කිරීමේ ව්‍යාපෘතිය මඟින් මෙම වසරේදී එම වතුයායේ අක්කර 405 කට ආසන්න ප්‍රමාණයක කජු පැළ සිටුවා අවසන්කර ඇත. එය 2017 වර්ෂයේදී සංස්ථාව ලැබූ විශේෂ ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය. මීට අමතරව කමන්දළුව වතුයායේ නව වගාව යටතේ කජු අක්කර 05 ක් හා පොල් අක්කර 07 ක පැළ සිටුවා අවසන්කර ඇති අතර තිරියාය වතුයායේ අක්කර 05 ක පැළ සිටුවා ඇති අතර අක්කර 08 ක ප්‍රමාණයක අර්ධ වශයෙන් කැළෑ එළිකිරීමේ කටයුතු අවසන්කර ඇත. තවද, පහත වතුයායන්වල පාළු පැළ සිටුවන ලදී.

කොණ්ඩච්චි	-	පැළ 8585	මහඔය	-	පැළ 200
ඔයාමඩුව	-	පැළ 400	කමන්දළුව	-	පැළ 250

සංස්ථාවේ බීජ උද්‍යානවල නව වගාව යටතේ මහඔය බීජ උද්‍යානයේ අක්කර 20 ක කජු වගා කරන ලදී.

(3.2.1.4) උතුරු පළාත් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම

2017 වර්ෂයේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ සෘජු අධීක්ෂණය හා ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසංධාන අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වයෙන් ආරම්භ කරන ලද මෙම වැඩසටහන යටතේ යාපනය සහ මුලතිව් දිස්ත්‍රික්කවල පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සමඟ සම්බන්ධීකරණය වෙමින් එම දිස්ත්‍රික්කවල ගොවීන් 1100 කට ආසන්න පිරිසක් සඳහා බීජ පැළ 76000 ක් ලබාදීමේ කටයුතු සිදු කරන ලද අතර, මේ යටතේ අක්කර 1900 ක කජු වගා කිරීමට කටයුතු කරන ලදී.

(3.2.1.5) ඵලදායිතාවය වැඩි දියුණු කිරීම

කජු වගාවේ රෝග හා පළිබෝධ මර්ධනය හා ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයෙන් (GAP) ඵලදායිතාවය ඉහළ නැංවීමේ අරමුණින් "හෙලෝපෙල්ටිස්" ආසාදනය සහ කඳ හා මුල් විදින පණු රෝග මර්දනය කිරීම සඳහා පළිබෝධ මර්දන වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව, ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ අනුග්‍රහයෙන් ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය හා කජු වගාවේ පළිබෝධ මර්දනය පිළිබඳ පුහුණු වැඩසටහන් 20 ක් පවත්වා ඇති අතර ඒ සඳහා ගොවීන් 1471 ක් සහභාගී විය.

(3.3) අලෙවි හා පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය

(3.3.1) පසු අස්වනු තාක්ෂණ සංවර්ධනය

(3.3.1.1) පිරිසැකසුම්කරුවන්ගෙන් කජු මද මිලට ගැනීම

වෙළඳපොල තරඟකාරී තත්ත්වයනට මුහුණදීම හා පිරිවැය අවම කිරීමේ පරමාර්ථයෙන් මෙම වර්ෂයේදී ගොවීන්ගෙන් ලෙලිකජු මිලදී ගැනීම

වෙනුවට කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන්ගෙන් කජු මද මෙ.ටොන් 4.8 ක් හා ලෙලි කජු මෙ.ටොන් 63.0 ක් මිලදී ගන්නා ලදී. මේ නිසා තරඟකාරී වෙළඳපොල මිල පරාසයක් ස්ථාපිත විය. මෙම වර්ෂයේ සංස්ථා වතුයායන්ගෙන් ලැබුණු මෙට්‍රික් ටොන් 66.4 ක අස්වැන්නද සංස්ථා කර්මාන්තශාලාවල පිරිසැකසුම් කරන ලදී.

(3.3.1.2) කජු පිරිසැකසුම් කර්මාන්තය ශක්තිමත් කිරීම

උසස් ප්‍රමිතියෙන් යුක්ත වූ කජු මද නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීම මගින් ඉහල මිලක් උපයාගැනීම පිණිස උසස් නිෂ්පාදන යාන්ත්‍රණයක් අත්‍යාවශ්‍ය වේ. මෙම වැඩසටහනට අනුකූලව කජු පිරිසැකසුම්කරුවන් සඳහා විජලන යන්ත්‍ර හා විදුලි බලයෙන් ක්‍රියාත්මක කරන කජු කැපීමේ යන්ත්‍ර ලබාදීම, ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද භාවිතයෙන් (GMP) හා අගය එකතු කිරීම හා ප්‍රමිති තත්ත්වයන් සම්බන්ධව පිරිසැකසුම්කරුවන් පුහුණු කිරීමත්, පිරිසැකසුම් සමිති සඳහා මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා සහායවීම හා වෙළඳපොල ප්‍රවර්ධනය සඳහා සහාය ලබාදීම සිදුකරන ලදී .

(3.3.2) කජු පිරිසැකසුම් කිරීම හා අලෙවිකරණය

සංස්ථාවට අයත් කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන පුත්තලම හා නැඳගමුව (ගම්පහ දිස්ත්‍රික්කය) පිහිටා ඇත. සංස්ථා වතුයායන්ගෙන් ලබාගන්නා ලද ලෙලිකජු පිරිසැකසුම් කර, අගය එකතු කරන ලද කජු මද කොල්ලුපිටිය හා රාජගිරියේ පිහිටි සංස්ථා අලෙවිසැල් 02 ට අමතරව දිවයිනේ ව්‍යාප්තව පවතින වරලත් අලෙවිසැල් 56 ක් උපයෝගී කරගෙන පාරිභෝගිකයන් වෙත අලෙවි කටයුතු පවත්වාගෙන යන ලදී.

2017 වර්ෂයේදී කජු පුහුලන් වට්නි වෙළඳපොළට නිකුත්කරන ලද අතර වීස් සහ සුදු ඒණු තැවරු කජු පර්යේෂණ මට්ටමින් අත්හදා බැලීමේ අදියරේ පවතී. නව තාක්ෂණික ක්‍රම භාවිතය, අගය එකතු කිරීම හා උසස්

කජු නිෂ්පාදන අළෙවි කිරීම මගින් රු. මිලියන 87.96 ක මුදලක් උපයා ගැනීමට සංස්ථාව සමත්විය.

(3.3.3) කජු නිෂ්පාදන අපනයනය හා විදේශ විනිමය ඉපැයීම

(3.3.3.1) 2017 වර්ෂයේදී උසස් තත්ත්වයේ අගය එකතුකරන ලද කජු මද මෙට්‍රික් ටොන් 59.04 ක් ජාත්‍යන්තර වෙළඳපොළට ඉදිරිපත් කිරීම මගින් රු. මිලියන 143.51 ක විදේශ විනිමය ඉපැයීමට ශ්‍රී ලංකාව සමත්විය. 2016 වර්ෂයේ අගය එකතුකරන ලද කජු මද මෙට්‍රික් ටොන් 57.64 ක් අපනයනය කිරීමෙන් රු. මිලියන 99.97 ක විදේශ විනිමයක් උපයා ගෙන ඇත. මේ අනුව, 2017 වර්ෂයේදී අපනයන ධාරිතාවය හා විදේශ විනිමය ඉපයීම 2016 වර්ෂයට වඩා වැඩිවීමක් පෙන්නුම් කරන අතර සංචාරක කර්මාන්තයේ සීඝ්‍ර වර්ධනයත් සමඟ කජු මද සඳහා දේශීය ඉල්ලුම ඉහළ යාමත්, ඒ අනුව දේශීය පරිභෝජනය ඉහළයාම ද සිදු වී ඇත.

(3.3.4) කජු ආනයනය

(3.3.4.1) දේශීය පරිභෝජනය සඳහා ආනයනය

දේශීය වශයෙන් කජු පරිභෝජනය ඉහළ යාමත්, දේශගුණික විචල්‍යතා එනම් මල් හටගන්නා කාලසීමාව තුල අධික නියඟයකට මල් වියළීමට ලක්වීම නිසා අපේක්ෂිත කජු අස්වැන්න අඩුවීම සමඟම විශේෂයෙන් ජනවාරි, පෙබරවාරි හා මාර්තු යන මාසවල කුඩා පරිමාණ කජු පිරිසැකසුම්කරුවන්ට අවශ්‍ය ලෙලිකජු දේශීය වෙළඳපොලතුල හිඟතාවයක් ඇතිවිය. මේ සඳහා විසඳුමක් වශයෙන් කුඩා පරිමාණ කජු පිරිසැකසුම්කරුවන් සඳහා බදු සහන යටතේ ලෙලිකජු ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදෙන ලදී. මෙම ආනයන බලපත්‍ර තාවකාලික පදනම මත දේශීය නිෂ්පාදන වෙළඳපොලෙහි හිඟ කාලයේදී පමණක් ලබාදීම සිදු කරයි. ශ්‍රී ලංකා රේගුවේ වාර්තාවලට අනුව, ලෙලිකජු මෙට්‍රික් ටොන්

2108.82 ක් හා කජු මද මෙට්‍රික් ටොන් 160.82 ක් ආනයනය කර කුඩා පරිමාණ නිෂ්පාදකයන් විසින් පිරිසැකසුම්කරුවන් රාශියක් අතර බෙදාහරින ලදී. මේ අනුව, කජු පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන පවුල්වල ජීවනෝපාය ස්ථාවර කිරීම සඳහා සංස්ථාවට මැදිහත්වීමට අවස්ථාව ලැබුණි.

(3.4) පර්යේෂණ හා සංවර්ධනය

ශාක අභිජනනය, පොහොර භාවිතය, කජු වගාවේ රෝග හා පලිබෝධ මර්ධනය, බද්ධ කිරීමේ විවිධ තාක්ෂණික ක්‍රම අත්හදා බැලීම, බද්ධ හා බීජ කජු වගාව, පැළ ඝනත්වය, පසු අස්වනු තාක්ෂණය, අස්වැන්න සහ අතුරුභෝග වගාව පිලිබඳ අඛණ්ඩ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන් වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සමඟ ඒකාබද්ව ක්‍රියාත්මක කරන ලදී. පර්යේෂණ හා කළමනාකරණ කමිටුව මගින් මෙම වැඩසටහන්වල ප්‍රගතිය ඇගයීම සිදුකරන ලදී. මෙම පර්යේෂණවල ප්‍රතිඵල ව්‍යාප්ති සේවා ජාලය මගින් උපදේශන සේවා ලබාදීමේදී මෙන්ම ක්ෂේත්‍ර ආදර්ශන, පත්‍රිකා,වීඩියෝ සහ රූපවාහිනී වැඩසටහන් මගින් ගොවීන්වෙත ලබාදෙන ලදී. මේ යටතේ 2017 වර්ෂය තුලදී තෝරාගත් මව් ශාක/කජු ප්‍රභේදවල ජාන එකතුවක් ඉදිරි පර්යේෂණ කටයුතු සඳහා පුත්තලම වතුයායේ අක්කර 10 ක හා කමන්දළුව වතුයායේ අක්කර 6 ½ ක ස්ථාපිත කරන ලදී.

(4.0) <u>අයවැය</u>

(4.1)

වර්ගය	අරමුදල් ආයෝජනය - 2017 (රු. මිලියන)		
	රාජ්‍ය ආයෝජන	උපයාගත් අරමුදල්	එකතුව
ප්‍රාග්ධන වියදම්	54.00	-	54.00
පුනරාවර්තන වියදම්	54.00	71.02	125.02
එකතුව	**108.00**	**71.02**	**179.02**

(4.2) <u>වාණිජමය කාර්යයන් තුළින් 2017 වර්ෂයේ ඉපැයීම්</u>

		(රු.මි)
කජු මද අළෙවිය	-	90.52
කජු මව් බීජ හා පැළ අළෙවිය	-	9.49
පොල් අළෙවිය	-	1.32
එකතුව		101.33

(5.0) පරිපාලන කටයුතු

(5.1) කුඩා කජු ඉඩම් හිමියන්, කජු පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන්නන් හා පාරිභෝගිකයන් වෙත ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණ ඇතිව විධිමත් කළමනාකරණ භාවිතයන් සිදුකිරීමට හැකියාව ලැබුණි. රාජ්‍ය ව්‍යවසායක් ලෙස සේවාවන් සපයන අතර, ලාභ ඉපැයීමද අරමුණුකර ඇති බැවින් සංස්ථාවේ සියළුම පාර්ශවකරුවන්ගේ සහාය මේ සඳහා ලබාගත හැකිවිය.

මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ සහකාර සාමාන්‍යාධිකාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ සහායද නොමඳව ලැබුණි. රජයේ නව සංවර්ධන උපායමාර්ගවලට අනුකූලව ජනතාවගේ ආදායම් උත්පාදනය හා සංස්ථාවේ අරමුණු මුදුන්පත් කරගැනීම සඳහාද, මේ අනුව කටයුතු කලහැකි විය.

(5.2) 2017-12-31 දිනට කාර්යය මණ්ඩලයේ තත්ත්වය

අනුමත කාර්යය මණ්ඩලය		2017.12.31 දිනට කාර්ය මණ්ඩලය
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ ශ්‍රේණිය (HM)	02	02
මධ්‍යම කළමනාකරණ ශ්‍රේණිය MM)	07	05
කනිෂ්ඨ කළමනාකරණ ශ්‍රේණිය (JM)	26	18
කළමනාකරණ සහකාර (MA)	122	88
සුළු ශ්‍රේණිය (PL)	67	65
එකතුව	224	178

මෙයට අමතරව සංස්ථාවේ පිරිසැකසුම් මධ්‍යස්ථාන, වතුයායන්, ශාක අභිජනන මධ්‍යස්ථාන හා මධ්‍යම පැළ තවාන් වල මාසික අවශ්‍යතා මත චෙක් රෝල් කම්කරුවන් 200 ක් පමණ සේවයේ යොදවා ඇත.

(6.0) <u>ජයග්‍රහණ</u>

වර්ෂ 2015 දී හා 2016 දී වාර්තාගත වූ අලෙවි කාර්යයන් මගින් ලාභ ලබන තත්ත්වය වර්ෂ 2017 දී අඛණ්ඩව පවත්වාගැනීමට සමත්විය. මේ සඳහා සංස්ථාවේ වාණිජමය ක්‍රියාකාරකම් උපයෝගී කරගත් අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායි හා කාර්යක්ෂම මඟ පෙන්වීම හා කාර්යය මණ්ඩලයේ කැපවීම මේ සඳහා හේතු සාධක විය.

වාණිජමය ක්‍රියාකාරකම් මගින් 2017 වර්ෂය තුළදි සංස්ථාව උපයනු ලැබූ ශුද්ධ ලාභය රුපියල් මිලියන 16.34 කි.

පහත සඳහන් බාධක නිසා අත්පත් කරගත් ලාභය මීට වඩා ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකියාව නොලැබුණි.

★ අයහපත් කාලගුණ තත්ත්වයන් මත එනම් මල් හටගන්නා කාලසීමාව තුල අධික නියඟයකට ලක්වීම හේතුවෙන් මල් වියළීමට ලක්වීම නිසා වතුයායන් වල අස්වැන්න අපේක්ෂිත මට්ටමට වඩා අඩුවීම.

★ දේශීය ලෙලිකජු ඉල්ලුමට සරිලන සැපයුමක් වාර්තා නොවීම නිසා කජු නිෂ්පාදනවලට ඉහළ මිලගණන් නියම වීම.

★ කම්කරු වියදම් හා ද්‍රව්‍ය වියදම් ඉහළ යාම.

★ පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදානයන් සීමාකිරීම හේතුවෙන් නව කාර්යයන් ආරම්භ කිරීමේදී මෙන්ම අත්‍යාවශ්‍ය සේවාවන් ඉටුකර ගැනීමේදී බාධා පැමිණුනි. මේ අනුව මෙම කාර්යයන් අඛණ්ඩව සිදුකර ගැනීම සඳහා සංස්ථාව විසින් උපයාගත් අරමුදල් උපයෝගී කර ගැනීමටද සිදුවිය.මෙහි ප්‍රතිඵලයක් ලෙස වාණිජමය හා සංවර්ධන කාර්යයන්හි ආයෝජනය සඳහා අරමුදල් හිඟතාවය ඇතිවිය.

(7.0) <u>ස්තුතිය</u>

2017 වර්ෂය තුලදී ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සියළුම සේවාවන් සැපයීම සහ වාණිජ කටයුතු ඉතා සතුටුදායක අන්දමින් පවත්වාගෙන යාමට හැකිවූ අතර, ඒ සඳහා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත දක්වන ලද සහයෝගීතාවය පිළිබඳව මාගේ හෘදයාංගම ස්තුතිය හා ප්‍රණාමය ඔවුන්වෙත පුද කරමි.

විශේෂයෙන්ම සංස්ථාවේ සියළුම ක්‍රියාකාරකම් ඉහළ ඵලදායිතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් යුතුව පවත්වාගෙන යාම සඳහා සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් ඇතුළු සියළු කාර්ය මණ්ඩලය දැඩි කැපවීමකින් යුතුව කටයුතුකල අතර, ඔවුන්ගේ සේවයද අගය කරමි.

කුඩා පරිමාණයේ පිරිසැකසුම්කරුවන්, කජු නිෂ්පාදන අපනයනකරුවන්, කුඩා කජු ඉඩම්හිමියන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සියළුම පාර්ශවකරුවන් මා වෙත දක්වන ලද සහයෝගය සහ කැපවීම මත මෙම සාර්ථකත්වය ළඟාකර ගැනීමට හැකිවූ අතර, එයද අගය කරමි.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය ගරු කබීර් හෂීම් මැතිතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා එම අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය විසින් අපවෙත ලබාදුන් මග පෙන්වීම වෙනුවෙන්ද ස්තුතිවන්ත වෙමි.

දම්සිරි බණ්ඩාර කරුණාරත්න
සභාපති
ශ්‍රී ලංකා කජු සංස්ථාව

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා කපු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මේ සමඟ ඉදිරිපත් කරමි.

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2003 ජුනි මස 2 වනදා නිකුත් කල චක්‍රලේඛ අංක පී.ඊ.ඩී/ 12 ට අනුව ශ්‍රී ලංකා කපු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි 28 වන දිනට පෙර විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

ආරම්භය

1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ අංක 60/7 දරණ ගැසට් නිවේදනය මගින් 1973 මැයි 25 දින ශ්‍රී ලංකා රජයේ අනුමැතිය හා එවකට වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ නියෝගය මත රුපියල් මිලියන 40 ක මූලික ප්‍රාග්ධනයකින් යුක්තව ශ්‍රී ලංකා කපු සංස්ථාව පිහිටුවන ලදී.

ප්‍රතිඵල

ප්‍රවර්ථන වසරෙහි මූල්‍ය ප්‍රතිඵල සහ ස්කන්ධය වෙනස්වීම පිළිබඳ දත්ත ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර ඇත.

ව්‍යාපාර සමාලෝචනය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ශ්‍රී ලංකා කපු සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇති අතර, ඒ පිළිබඳ ඇගයීමක් සභාපතිතුමාගේ වාර්තාවේ ඇතුලත්කර ඇත.

දේපල පිරියත හා උපකරණ

මූලා‍්‍ය ප්‍රකාශනයෙහි ප්‍රවර්ථන වසරට අදාලව දේපල පිරියත හා උපකරණවල සිදුවූ වෙනස්කම් සටහන් අංක 1 මගින් පැහැදිලි කර ඇත. මෙම සටහනෙහි පෙන්වන වටිනාකම් ඒවායේ වර්තමාන වෙලඳපොල අගය හා ප්‍රමාණාත්මක වෙනස්කම් නොපවතී.

ප්‍රධාන ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- කජු වගාකිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරිම හා අලෙවි කිරීම සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමට අමාත්‍යවරයාට උපදෙස් දීම.

- කජු වගාකිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරිම හා අලෙවි කිරීම පිළිබඳ කටයුතු කිරීම.

- කජු වගාකිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරිම හා අලෙවි කිරීම දියුණු කිරිමේ පරමාර්ථයෙන් විමර්ශන හා පර්යේෂණ කටයුතු කිරිම .

- කජු වගාකිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරිම හා අලෙවි කිරීම පිළිබඳ තාක්ෂණික, අලෙවි හා වෙනත් තොරතුරු රැස් කිරීම, පිළියෙල කිරීම ,ප්‍රසිද්ධ කිරීම සහ බෙදා හැරීම සහ ඒ කටයුතු වලදී අන් අය සමඟ එක්ව ක්‍රියා කිරීම.

- කජු සහ කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා පිහිටුවනු ලබන කර්මාන්තශාලා පිහිටුවිය යුතු ස්ථාන, ඒවායේ ප්‍රමාණය හා තාක්ෂණික ප්‍රමිති නිශ්වය කිරීම සහ අළුත් කර්මාන්තශාලා පිහිටුවීමටත් අවශ්‍ය අවස්ථාවලදී එවකට පවතින කර්මාන්තශාලා ක්‍රියා කරවීම.

- කජු සහ කජු නිෂ්පාදන මිලට ගැනීම, බෙදා හැරීම, විකිණීම සහ අපනයනය කිරීම.

- කජු වගා කිරීම පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම පිළිබඳ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම පිණිස පහසුකම් සැපයීම.

- කජු වගාවන්, පිරිසැකසුම් කිරීමේ පහසුකම් සහ අලෙවි කිරීම දියුණු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය මූලික සංවිධානය පිහිටුවීම සහ ඒවා පිහිටුවීමට ආධාරදීම.

- කජු නිෂ්පාදන ප්‍රචාරය කිරීම හා විකිණීම සඳහා අවශ්‍යයැයි සලකනු ලබන පියවර ගැනීම, ලෝකයේ වෙළඳපොලවල්වල ඒ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම සහ ඒ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාර්යයන් සඳහා ප්‍රචාරක කටයුතුවලට මුදල් යෙදවීම, ඒ කටයුතු අනුපාලනය කිරීම සහ ඒ කටයුතු වලට ආධාරදීම ආරම්භ කොට ඊට අනුග්‍රහ දැක්වීම.

සංචිත

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය තුල සංස්ථාවේ මුළු සංචිතවල සංයුතිය සඳහන්ව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

2017 දෙසැම්බර් 31 දින වන විට තේරිපත්වී සිටි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

(1) 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජිකයන්

i) **ඩී.බී.කරුණාරත්න මහතා - සභාපති**

ii) එම්.ඩබ්.එම්.බණ්ඩාරතිලක මහතා - නියෝජ්‍ය සභාපති

iii)	ඒ.ඒ.ඩී.එස්.අතපත්තු මහත්මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මහා භාණ්ඩාගාර නියෝජිත)
iv)	එම්.ආර්.එම්.අයි.රීසා මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
v)	වී.මංචනායක මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
vi)	කේ.ලිංගරාජා මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
vii)	ඒ.එස්.එම්.ෆස්මි මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2017 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් - කීර්ති ජයකොඩිආරච්චි මහතා (සාමාන්‍යාධිකාරී)

විගණන කමිටුව

රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශනයන්ට (Public Enterprises Guideline) අනුකූලව සංස්ථාවේ විගණන කමිටුව පිහිටුවා ඇත.

ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට සහ සේවකයන්ට ගෙවියයුතු සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිසියාකාරව ගෙවා ඇත.

පාරිසරික ආරක්ෂාව

පරිසරයට අහිතකර කිසිඳු ක්‍රියාකාරකමකට සංස්ථාව මැදිහත් වී නොමැත.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු ගිණුම් මගින් ගැලපීම් කිරීමට හෝ හෙළිදරව් කිරීම සඳහා කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැත.

විගණකවරු

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන රජයේ විගණකාධිපති විසින් විගණනය කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය මත,



කීර්ති ජයකොඩිආරච්චි

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

2005.07.01 දිනැති අංක 31 දරණ (PED 31) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව හා එම චක්‍රලේඛයට අදාලව වරින්වර සිදුකරන ලද සංශෝධනයන් වන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අංක 51, 53 හා 55 යන චක්‍රලේඛයන් (PED 51, PED 53, හා PED 55) මඟින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව ශ්‍රී ලංකා කප්‍රු සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කරන ලද අතර, එය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් හා නිරීක්ෂකයන් දෙදෙනෙකුගෙන් යුක්ත සමස්තය 07 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් විය.

අදාල කමිටුවේ සභාපතිවරයා ලෙස මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන විධායක නොවන අධ්‍යක්ෂවරයා ද, කමිටුවේ ලේකම්වරයා ලෙස මෙම සංස්ථාවේ සාමානාධිකාරී/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ද කටයුතු කරන ලදී.

2017 වර්ෂය හා අදාලව පවත්වන ලද සමස්ත විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ගණන 04 ක් වූ අතර, එම රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ හා නිරීක්ෂකයන්ගේ සහභාගීත්වය පහත පරිදි විය.

01. ඒ.ඒ.ඩී.එස් අතපත්තු මහත්මිය : කමිටු සභාපතිනිය 4/4
විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මහා භාණ්ඩාගාර නියෝජිත)

02. වී.පී.මංචනායක මහතා : කමිටු සාමාජික 3/4
විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

03. එම්.ආර්.එම්.අයි. රීසා මහතා : කමිටු සාමාජික 4/4
විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

04. ඩී.කේ. ජයකොඩිආරච්චි මහතා : කමිටු ලේකම් 4/4
සාමාන්‍යාධිකාරි/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

05. වී.යු. ලියනගේ මහතා : කමිටු සාමාජික 4/4
සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන

06. ඩී.ජී.එච්.ඩී.පෙරේරා මහතා : කමිටු නිරීක්ෂක 2/2
ප්‍රධාන අභ්‍යන්තර විගණක රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය 2017.10.20 දින සිට

07. ආර්.පී.එස් පද්මිණී මහත්මිය: කමිටු නිරීක්ෂක 4/4
විගණන අධිකාරී (විගණකාධිපති දෙපාර්තමේන්තුව)

2017 වර්ෂයේ පළමු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී 2017 වර්ෂයේ පළමු කාර්තුව සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාව සිය සමස්ත ක්‍රියාකාරකම් මඟින් අත්කර ගෙන ඇති ප්‍රගතිය පිළිබඳව ඉදිරිපත් කර තිබූ වාර්තාව සම්බන්ධයෙන් ද, 2017 වර්ෂයේ පළමු කාර්තුව තුළදී සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් පාලනාධිකාරිය වෙත නිකුත් කරන ලද විගණන වාර්තාවල ඇතුලත් නිරීක්ෂණයන් හා එම නිරීක්ෂණයන්ට අනුව පාලනාධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ඉදිරිපත් කර තිබූ වාර්තාව සම්බන්ධයෙන් ද කමිටුව විසින් දීර්ඝ සමාලෝචනයක් සිදුකරන ලදී. තවද, මෙහිදී විගණකාධිපති දෙපාර්තමේන්තුව මඟින් කොණ්ඩච්චි වතුයාය සහ පුත්තලම ආච්චිගේ වතුයාය පරීක්ෂා කිරීම, කජු වගා සහනාධාර වැඩසටහන හා කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන පරීක්ෂාව සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන විමසුම් හා ඒවායේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් අදහස් දැක්වීම් හා ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ද වෙන් වෙන් වශයෙන් කරුණු සාකච්ඡා කරන ලදී.

2017 වර්ෂය හා අදාලව පවත්වන ලද දෙවන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී 2016 වර්ෂය සඳහා මුදල් පනතේ 13 (7)(ඒ) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කර ඇති විගණකාධිපති වාර්තාවේ අන්තර්ගත විගණන ඡේද සඳහා සංස්ථා පාර්ශවයෙන් සිදුකරනු ලබන අදහස් දැක්වීම් හා ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව ඉදිරිපත් කර තිබූ වාර්තාව සම්බන්ධයෙන් කමිටුවේ අවධානය යොමු විය. ඒ අනුව, වාර්තාවේ සඳහන් එක් එක් විගණන නිරීක්ෂණයන් වෙන් වෙන් වශයෙන් ගෙන එහි අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් කමිටුව වෙත ඉදිරිපත්කර තිබූ කෙටුම්පත් වාර්තාව මඟින් ඉදිරිපත්කර තිබූ අදහස් දැක්වීම් හා ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳව කමිටුව විසින් දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කරන ලද අතර කෙටුම්පත් වාර්තාවේ අන්තර්ගතය සම්බන්ධයෙන් සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ නිසා අදාල කෙටුම්පත් වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

මීට අමතරව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අනුගමනය කළ යුතු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සම්බන්ධයෙන් පවතින

ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති උපදේශක කමිටුවේ සහය ලබා ගැනීම, සංස්ථා කාර්ය මණ්ඩල සාමාජිකයින් විශ්‍රාම ගැනීමේදී ඉතිරිකර ගත් විවේක නිවාඩු සඳහා දීමනා ලබාදීම පිළිබඳව සහ පුත්තලම සහ නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානවල ලෙලි කපු තැම්බීමට යොදා ගන්නා බොයිලේරු නිෂ්ක්‍රීයව පැවතීම පිළිබඳව ද කමිටුව විසින් දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කරන ලදී.

2017 වර්ෂයේ තුන්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී, 2017 වර්ෂයේ තුන්වන කාර්තුව තුලදී සංස්ථාවේ සමස්ත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පිළියෙල කරන ලද ප්‍රගති වාර්තාව සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කරන ලද අතර සංස්ථාවේ වතුයායන්වල නව වගාව, පර්යේෂණ හා සංවර්ධන කටයුතු, මානව සම්පත් සංවර්ධනය සහ ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම යන කරුණු සම්බන්ධයෙන් කමිටුවේ විශේෂ අවධානය යොමු විය.

එසේම, 2017 වර්ෂයේ තුන්වන කාර්තුව තුලදී සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් පාලනාධිකාරිය වෙත නිකුත් කරන ලද විගණන වාර්තාවල ඇතුලත් නිරීක්ෂණයන් හා එම නිරීක්ෂණයන්ට අනුව පාලනාධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව කමිටුව වෙත ඉදිරිපත්කර තිබූ වාර්තා සම්බන්ධයෙන් කමිටුව විසින් දීර්ඝ සමාලෝචනයක් සිදුකරන ලද අතර, එහිදී 2016 වර්ෂයට අදාලව මන්නාරම, කිලිනොච්චිය, යාපනය, මුලතිව්, වවුනියාව සහ අම්පාර දිස්ත්‍රික්කයන්හි පිහිටා ඇති බාහිර පැළ තවාන්කරුවන් සඳහා වන ගෙවීම් සහ සංස්ථාවට අයත් රාජගිරිය කපු අලෙවිසැලේ පවතින කපු මද තොග හා මුදල් සම්බන්ධයෙන් සහ ප්‍රධාන කාර්යාල ගබඩාවේ පවතින කපු මද තොග සම්බන්ධයෙන් ඉදිරිපත්කර තිබූ අභ්‍යන්තර විගණන වාර්තා සම්බන්ධයෙන් කමිටුව විසින් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

2017 වර්ෂයට අදාල හතරවන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා 2018 වර්ෂයට අදාල සංස්ථාවේ කෙටුම්පත් ක්‍රියාත්මක සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම කමිටුව වෙත ඉදිරිපත් කර තිබූ අතර, ඉහත සඳහන් කරන ලද

ලේඛනයන්හි අන්තර්ගතය සම්බන්ධයෙන් කමිටු රැස්වීමේදී දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කරන ලදී.

ඒ අනුව එම කෙටුම්පත් ක්‍රියාත්මක සැලැස්මෙහි ප්‍රාග්ධන වියදම් යටතේ අන්තර්ගත සහනාධාර කජු වගා යෝජනා ක්‍රමය සහ සංස්ථා වතුයායන් සඳහා පැළ නිෂ්පාදනය කිරීම යන ක්‍රියාකාරකම් සහ වාණිජ ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබූ පසු අස්වනු තාක්ෂණය සහ අලෙවි ප්‍රවර්ධනය යන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සිදු කළ යුතු සංශෝධනයන්ට යටත්ව සිදුකර එම කෙටුම්පත් ලේඛන සම්බන්ධයෙන් අදාල නිර්දේශයන් සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

එසේම, 2017.10.01 දින සිට 2017.11.30 දින දක්වා වන මාස 02 ක කාලසීමාව තුලදී සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් පාලනාධිකාරිය වෙත නිකුත්කරන ලද විගණන වාර්තාවල ඇතුලත් නිරීක්ෂණයන් හා එම නිරීක්ෂණයන්ට අනුව පාලනාධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ඉදිරිපත්කර තිබූ වාර්තාව සම්බන්ධයෙන් ද කමිටුව විසින් දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කරන ලද අතර, එහිදී සංස්ථාවේ ප්‍රධාන කාර්යාල කාර්ය මණ්ඩලයේ දෛනික සේවය සඳහා පැමිණීම්, සේවය අවසන්කර පිටව යාම් හා නිවාඩු ලබා ගැනීම් සම්බන්ධයෙන් සහ සංස්ථා වරලත් අලෙවිසැල් වෙත සිදු කරනු ලබන කජු මද ණයට විකුණුම් සඳහා මුදල් අය කරවා ගැනීමේදී පවතින කාලප්‍රමාදයන් පිළිබඳව කමිටුවේ විශේෂ අවධානය යොමු වූ අතර, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් අදාල නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ.ඒ.ඩී.එස් අතපත්තු
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව

ශ්‍රී ලංකා කජු සංස්ථාව

2017 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව

01. කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය හා සංවර්ධන වැඩසටහන්

1.1 කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය

භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය යටතේ මෙම වර්ෂය තුල බද්ධ කජු අක්කර 2363 ක් හා බීජ කජු අක්කර 2137 ක් වශයෙන් මුළු අක්කර 4500 ක් දිස්ත්‍රික්ක 19 ක් ආවරණය වන පරිදි වගාකර ඇත. ගොවි පවුල් 14932 ක් සඳහා මෙමගින් ප්‍රතිලාභ ලැබුණි. 2017 වර්ෂයේදී මෙම සහනාධාර වැඩසටහන යටතේ විශේෂයෙන් ගෙවතු වගාව සඳහා ද පැළ ලබාදෙන ලදී. මේ සඳහා වැයවුණු මුළු වියදම රු.මිලියන 15.97 කි.

02. වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම

2.1 රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

විවිධ ප්‍රදේශවලට උචිත නව ප්‍රභේද අභිජනනය කර කුඩා කජු ඉඩම් හිමියන්වෙත ලබාදීම සඳහා මාතලේ දිස්ත්‍රික්කයේ නාලන්ද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය සහ ඔයාමඩුව, අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය, මඩකලපුව දිස්ත්‍රික්කයේ මාණ්කර්නි, මන්නාරම දිස්ත්‍රික්කයේ කොණ්ඩච්චි, හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරවිල සහ මොණරාගල දිස්ත්‍රික්කයේ සුදුවතුරආර යන ශාක අභිජනන මධ්‍යස්ථාන නඩත්තුකරන ලදී. ව්‍යාප්ති සේවා සහ වාණිජමය කාර්යයන් සඳහා අවශ්‍ය බද්ධ පැළ නිෂ්පාදනය සඳහා අවශ්‍ය ඉහළ ගුණාත්මයෙන් සමන්විත මවුබීජ 560000 ක් හා අංකුර 200000 ක් මෙමගින් ලබාගන්නා ලදී. මේ සඳහා වැයවූ මුළු මුදල රු. මිලියන 11.88 කි.

2.2 නිෂ්පාදනය වැඩිදියුණු කිරිම

කජු වගාවේ රෝග හා පළිබෝධ මර්ධනය හා ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයෙන් (GAP) ඵලදායිතාවය ඉහළ නැංවීමේ අරමුණින් “හෙලෝපෙල්ටිස්” රෝග ආසාදනය සහ කඳ හා මුල් විදින පණු රෝග මර්දනය කිරිම සඳහා පළිබෝධ මර්දන වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව, ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අනුග්‍රහයෙන් ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය හා කජු වගාවේ පළිබෝධ මර්දනය පිළිබඳ පුහුණු වැඩසටහන් 20 ක් පවත්වා ඇති අතර ඒ සඳහා ගොවීන් 1471 ක් සහභාගී විය. මේ සඳහා වැය වු මුදල රු.මිලියන 1.07 කි.

2.3 පැළ තවාන් කලමනාකරණය

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් 07 ක් කමන්දළුව වතුයායේ හා අළුත්තරම, හාඩි, මිහින්තලේ, චන්ද්‍රිකාවැව, දඹුල්ල හා කුඹුක්කන පිහිටා ඇත. නවීන තාක්ෂණය උපයෝගී කරගෙන බද්ධ පැළ නිපදවීම සඳහා සාදන ලද පොලිදැල් ගෘහ 06 ක් කමන්දළුව, මිහින්තලේ, මඩකලපුව, අළුත්තරම පැළ තවාන්වල ඉදිකර ඇත. මෙම තවාන්වල 2017 මහ කන්නය සඳහා උසස් තත්ත්වයේ බද්ධ පැළ 328456ක් නිෂ්පාදනය කර ගොවීන්වෙත ලබාදෙන ලදී.

2.4 උතුරු පළාත් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම

2017 වර්ෂයේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ සෘජු අධීක්ෂණය හා ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසංධාන අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වයෙන් ආරම්භ කරන ලද මෙම වැඩසටහන යටතේ යාපනය සහ මුලතිව් දිස්ත්‍රික්කවල පිහිටා ඇති ප්‍රාදේශීය කාර්යාල සහ දිස්ත්‍රික් කාර්යාල සමඟ සම්බන්ධීකරණය වෙමින් එම දිස්ත්‍රික්කවල ගොවීන් 1100 කට ආසන්න පිරිසක් සඳහා බීජ පැළ 76000 ක් ලබාදීමේ කටයුතු සිදු කරන ලද අතර මේ යටතේ අක්කර 1900 ක කජු වගා කිරීමට කටයුතු කරන ලදී.

03. පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්

වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. ශාක අභිජනනය, පොහොර භාවිතය, පැළ සනත්වය, කජු වගාවේ රෝග හා පළිබෝධ මර්ධනය, අතුරු භෝග වගාව, බද්ධ හා බීජ වගාවන්, බද්ධ කිරීමේ තාක්ෂණික ක්‍රමවේද අස්වැන්න පිළිබඳව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. අදාල පර්යේෂණ ප්‍රතිඵල සම්බන්ධයෙන් වැඩමුළු සහ ව්‍යාප්ති සේවාවන් මගින් ගොවීන් දැනුවත් කරනු ලැබේ. මේ යටතේ 2017 වර්ෂය තුලදී තෝරාගත් මව් ශාක/කජු ප්‍රභේදවල ජාන එකතුවක් ඉදිරි පර්යේෂණ කටයුතු සඳහා පුත්තලම වතුයායේ අක්කර 10 ක හා කමන්දළුව වතුයායේ අක්කර 6 ½ ක ස්ථාපිත කරන ලදී. මේ සඳහා වැයවූ මුදල රු. මිලියන 3.47 කි.

04. සංස්ථා වතුයායන් නඩත්තු කිරීම හා වගා පුනරුත්ථාපනය

2017 වර්ෂය තුළ පුත්තලම ආච්චිගේ වතුයායේ පැවති පැරණි ගස් ඉවත්කර රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද අතුරු බෝග වගා කිරීමේ ව්‍යාපෘතිය මඟින් මෙම වසරේදී එම වතුයායේ අක්කර 405 කට ආසන්න ප්‍රමාණයක කජු පැළ සිටුවා අවසන්කර ඇත. මීට අමතරව, කමන්දළුව වතුයායේ නව වගාව යටතේ කජු අක්කර 05 ක් හා පොල් අක්කර 07 ක පැළ සිටුවා අවසන්කර ඇති අතර තිරියාය වතුයායේ අක්කර 03 ක පැළ සිටුවා ඇති අතර අක්කර 08 ක ප්‍රමාණයක අර්ධ වශයෙන් කැළෑ එළිකිරීමේ කටයුතු අවසන්කර ඇත. තවද, පහත වතුයායන්වල පාළු පැළ සිටුවන ලදී.

කොණ්ඩච්චි	-	පැළ 8585	මහඹය	-	පැළ 200
ඔයාමඩුව	-	පැළ 400	කමන්දළුව	-	පැළ 250

සංස්ථාවේ බීජ උද්‍යානවල නව වගාව යටතේ මහඹය බීජ උද්‍යානයේ අක්කර 20ක කජු වගා කරන ලදී. වතුයායන්වලින් මෙට්‍රික් ටොන් 66.4 ක ලෙලිකජු අස්වැන්නක් ලැබුණි.මීට අමතරව ඵලදායිතාවය ඉහළ නැංවීම පිණිස රසායනික පොහොර යෙදීම, වල් මර්ධන කටයුතු,රෝග හා පළිබෝධ මර්ධනය, ක්ෂේත්‍ර මාවත් නඩත්තු කිරීම, කප්පාදු කිරීම ආදී ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේදයන්ද සිදුකරන ලදී. මේ සඳහා වැයවූ මුළු මුදල රු. මිලියන 14.70 කි.

05. පසු අස්වනු තාක්ෂණය

5.1 අලෙවිකරණය හා පිරිසැකසුම් කර්මාන්ත ප්‍රවර්ධනය

සංස්ථා වතුයායන්ගෙන් ලද ලෙලි කජු අස්වැන්න සහ කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන්ගෙන් මිලදීගත් කජු මද පුත්තලම සහ නැඳගමුවෙහි පිහිටි පිරිසැකසුම් මධ්‍යස්ථානවලදී පිරිසැකසුම් කරන ලදී. ඒවා අගය එකතුකල නිෂ්පාදන ලෙස සංස්ථාවේ ප්‍රධාන අලෙවිසැල් මගින් අලෙවිකරන ලදී. මේ සඳහා වරලත් අලෙවිසැල් 56 කින් සමන්විත සංස්ථා අලෙවිසැල් ජාලයක් උපයෝගී කරගන්නා ලදි.

2017 වර්ෂයේදී කජු පුහුලන් වට්නි වෙළඳපොළට නිකුත්කරන ලද අතර වීස් සහ ඵෑණු තැවරූ කජු පර්යේෂණ මට්ටමින් අත්හදා බැලීමේ අදියරේ පවතී. අලෙවි කටයුතු මගින් සංස්ථාව උපයන ලද මුළු ආදායම රු. මිලියන 87.96 කි.

06. මානව සම්පත් සංවර්ධනය

කාර්ය මණ්ඩලයේ සියළුම තරාතිරම්වල නිලධාරීන්ගේ පුහුණුව හා සංවර්ධනය සඳහා අවශ්‍ය සේවාස්ථ පුහුණු සැසි පැවැත්වීමට කටයුතු සිදුකරන ලදී. මෙමගින් කාර්ය ඵලදායිතාවය ඉහළ නැංවීමටත් ඔවුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීමටත්, නව දැනුම ලබාගැනීමටත් අවස්ථාව සැලසුණු අතර, ස්වයං පෙළඹවීම මගින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ඉඩප්‍රස්ථාව සැලසුනි. 2017 වසර තුළ සේවකයින්ගේ හැකියාව සහ වෘත්තීමය ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වෘත්තීය පුහුණුව හා මඟපෙන්වීම සංස්ථා කාර්ය මණ්ඩලයේ සේවකයින් 60 දෙනෙකු සඳහා ලබා දී ඇති අතර මීට අමතරව ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අනුග්‍රහය ඇතිව සංස්ථාවේ කජු සංවර්ධන නිලධාරීන්ට සහ ක්ෂේත්‍ර සහායක නිලධාරීන් 41 දෙනෙකු සඳහා ඔවුන්ගේ වෘත්තීමය ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම උදෙසා දින 02 ක නේවාසික පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මේ සඳහා වැය වූ මුදල රු.මි 0.28 කි.

<u>ශ්‍රී ලංකා කජු සංස්ථාවේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග</u>

කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත ප්‍රධාන මධ්‍යකාලීන ක්‍රියාමාර්ග කිහිපයකි.

01. **ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය ඉහළ නැංවීම**
02. **කජු වගා ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම**
03. **කජු වගාවේ පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය**
04. **මානව සම්පත් සංවර්ධනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම.**

01. ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය ඉහළ නැංවීම

1.1 <u>ව්‍යාප්ති වැඩසටහන් යටතේ කජු වගාව</u>

ශ්‍රී ලංකාවේ කජු වගාව ප්‍රධාන වශයෙන් වියළි දේශගුණික කලාපය තුල ව්‍යාප්තව ඇත. පසුගිය දශක 03 ක කාලයක ක්‍රියාත්මක වූ යුධමය වාතාවරණය හේතුවෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පිහිටි කජු වගා බිම් අක්කර 30000 ක් පමණ විනාශ විය. එහෙත් වර්ෂ 2010 සිට සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාප්ති වැඩසටහන් යටතේ වර්ෂයකට අක්කර 7000 කට අධික ඉඩම් ප්‍රමාණයක් කජු වගාවට නැඹුරු කරවීමට සමත්විය.

භාණ්ඩාගාර අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාප්ති සහනාධාර යෝජනා ක්‍රමය යටතේ බද්ධ හා බීජ කජු වගාව වර්ෂයකට අක්කර 4500 බැගින් ඉදිරි වසර 03 තුල ක්‍රියාත්මක කරනු ඇත. තවද, පිරිස් බලය වැඩි ස්ථාන වශයෙන් ගැනෙන හමුදා කඳවුරු, බන්ධනාගාර, පොලිසිය සහ පූජාභූමි වැනි ස්ථානවල අතිරික්ත වශයෙන් තිබෙන ඉඩම්වල සහනාධාර යෝජනා ක්‍රමය යටතේ වර්ෂයකට වගා කිරීමට නියමිත අක්කර 4500 න් අක්කර 750 පමණ මෙ යටතේ වගා කිරීමට සැලසුම්කර

ඇත. සහනාධාර වැඩසටහන යටතේ ගෙවතු වගාව වශයෙන් වර්ෂයකට අක්කර 1200 ක් පමණ වගා කිරීමට ද සැලසුම්කර ඇත.

1.2 වගා පුනරුත්ථාපනය

සංස්ථා වතුයායන් වල නව වගාව හා පැරණි වගා පුනරුත්ථාපනය කිරීම 2011 වර්ෂයේ සිට ආරම්භ කරන ලදී.මේ යටතේ උතුරු පළාතේ කොන්ඩච්චි වතුයාය, නැගෙනහිර පළාතේ මාණික්කර්නි වතුයාය සංවර්ධනය හා පුනරුත්ථාපන කටයුතු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව ආරම්භ කරන ලදී. කොණ්ඩච්චි වතුයායේ අක්කර 4000 ක් පමණ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපෘතියක් යටතේ වගාකිරීමට සැළසුම් කර ඇත.

1.3 නව වගාව

පෞද්ගලික, කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ඉඩම් හිමියන් සතු කජු වගාවන් වල නව වගාවද වාර්ෂිකව අක්කර 500 පමණ සිදු කෙරෙන අතර, ඉදිරි වසර තුන තුල මෙම වගා නැඹුරුව අඛණ්ඩව පවතිනු ඇත. ඉහත සියළු වගා වැඩසටහන් මගින් අවම වශයෙන් වාර්ෂිකව අක්කර 7000 බැගින් කජු වගා භූමි ප්‍රමාණය ඉහළ නැංවීමට කටයුතු කරනු ඇත.

මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල 10 කින් සමන්විත ව්‍යාප්ති සේවා ජාලයක් ක්‍රියාත්මක කරනු ලබන අතර, දිස්ත්‍රික්ක 19 ක කජු වගා සංවර්ධන කටයුතු මෙමගින් ආවරණය කරනු ලබයි.

1.4 උතුරු පළාතේ කජු වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

මෙම වැඩසටහන 2017 වර්ෂයේ සිට අග්‍රාමාත්‍ය කාර්යාලයේ සෘජු අධීක්ෂණය හා ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසංධාන අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වයෙන් ආරම්භ කරන ලද අතර මේ යටතේ යාපනය සහ මුලතිව් දිස්ත්‍රික්කවල පිහිටා ඇති ප්‍රාදේශීය කාර්යාල සහ දිස්ත්‍රික් කාර්යාල සමඟ සම්බන්ධීකරණය වෙමින් එම දිස්ත්‍රික්කවල ගොවීන් 1100 කට ආසන්න පිරිසක් සඳහා බීජ පැළ 76000 ක් ලබාදීමේ කටයුතු සිදු කරන ලද අතර මේ යටතේ අක්කර 1900 ක කජු වගා කිරීමට කටයුතු කර ඇත.

මෙම වැඩසටහන 2018 වර්ෂයේදී ද ක්‍රියාත්මක කිරීමට සැලසුම් මේ වන විට සකස්කර ඇති අතර මෙමඟින් කිලිනොච්චි, මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්කවල පැළ 120000 ක් අක්කර 3000 ක වගා කිරීමට අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම මඟින් කජු වගා වපසරිය වැඩි කිරීම සහ නව ආදායම් මාර්ග උත්පාදනය කිරීමට ද බලාපොරොත්තු වේ. මෙම වැඩසටහන ඉදිරි වර්ෂ වලදී ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

02. කජු වගා ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම

ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය අක්කර 150108 ක් පමණ වන අතර, මින් 88% ක් පමණ කුඩා ඉඩම් හිමියන් වේ. බහුතරයක් ඉඩම්වල බීජ කජු ගස් වගාකර ඇති අතර, සංස්ථා වතුයායන්වල මෙන්ම මෙම ඉඩම්වලද කජු ගස් වල වයස අවුරුදු 20-35 පමණ වන අතර, එක් ගසකින් ලෙලිකජු කිලෝ ග්‍රෑම් 3-5 ක් අතර ප්‍රමාණයක් ලැබේ. වැඩි දියුණු කරනලද නව කජු ප්‍රභේදවලින් සමන්විත කජු වගාවන් ඇති වියට්නාමය, ඉන්දියාව වැනි රටවල ගසකින් කිලෝ ග්‍රෑම් 10-15 ත් අතර අස්වැන්නක් ලැබේ. මේ අනුව වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරයි.

2.1 නව ප්‍රභේද හඳුන්වාදීම

මේ අනුව වැඩි අස්වැන්නක් ලබාදෙන වැඩිදියුණු කල නව ප්‍රභේද 08 ක් සංස්ථාව විසින් ගොවීන්වෙත හඳුන්වා දී ඇත. වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ කටයුතු සිදුකෙරෙන අතර, WUCC 1, WUCC 5, WUCC 8, WUCC 9, WUCC 13, WUCC 19, WUCC 21, WUCC 23 යන ප්‍රභේද 08 එළුවන්කුලම, විලච්චිය, නාලන්ද, මහඔය, සුදුවතුර ආර හා ඔයාමඩුව යන වතුයායන් හා ශාක අභිජනන මධ්‍යස්ථානවල වගා කර ඇත. මෙම මව්ශාක වලින් අංකුර ලබාගෙන දිවයිනේ විවිධ දේශගුණික කලාපවලට උචිත නව ප්‍රභේද අභිජනනය කර ගොවීන් වෙත ලබාදීමට කටයුතු කරනු ලැබේ. වාර්ෂිකව නව ප්‍රභේද 02 බැගින් හඳුන්වාදීමට කටයුතු කරන අතර, මෙමගින් හෙක්ටයාරයකට ලැබෙන අස්වැන්න කිලෝ ග්‍රෑම් 1000 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

2.2 ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය

ඉතා අඩු අස්වැන්නක් ලබාදෙන බීජ කජු ගස් ඉවත්කර නැවත වගාව සිදුකිරීම සඳහා කුඩා ඉඩම් හිමියන් වාර්ෂිකව යොමු කරනු ලැබේ. ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයෙන් (Good Agricultural Practices) කජු වගාවේ අස්වනු ඵලදායිතාවය ඉහළ නැංවීම අරමුණු කර ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සහභාගීත්වය මත ගොවීන් පුහුණු කිරීමේ වැඩසටහන් වාර්ෂිකව සිදුකරනු ලැබේ. මෙය ඉදිරි වර්ෂ තුන තුලදීද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. දෘෂ්‍ය මාධ්‍ය මේ සඳහා උපයෝගී කරගනු ලැබේ. කජු ගස්වල මල් හටගන්නා කාලය තුල අධික වර්ෂාපතනය පැවතීම නිසා දළුමැරීමේ රෝගය ව්‍යාප්ත වේ.

මේ නිසා කජු අස්වැන්න 30%- 40% ත් අතර ප්‍රමාණයකින් අඩුවේ. මේ සඳහා කුඩා ඉඩම් හිමියන් දැනුවත් කිරීම අත්‍යාවශ්‍ය වී ඇත. පරිණත කජු වගාවන් තුල ඇති කඳපණු හානිය මර්ධනය කිරීම සඳහා පර්යේෂණ අංශ

සමඟ ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරන අතර මෙය ඉදිරි වර්ෂ තුන තුලදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

2.3 මධ්‍යම පැළ තවාන්

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් මිහින්තලේ, දඹුල්ල, කමන්දළුව වතුයාය, අළුත්තරම, කුඹුක්කන, හාඩි වතුයාය හා චන්ද්‍රිකාවැව යන ස්ථාන වල ස්ථාපිත කර ඇත. මෙම තවාන් මගින් නව ප්‍රභේද වලින් සමන්විත ඉහළ ගුණාත්මයෙන් යුක්ත බද්ධ පැළ සංස්ථා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ නිෂ්පාදනය කර ගොවීන් වෙත නිකුත් කරනු ලැබේ. වාර්ෂිකව බද්ධ පැළ 300000 ක් නිෂ්පාදනය කරන අතර, ඉදිරි වර්ෂ 03 තුලදීද වසරකට පැළ 350000 ක් බැගින් නිපදවීම අරමුණු කර ඇත. පැළ නිෂ්පාදනයේදී නව තාක්ෂණය භාවිතය වැඩිදියුණු කෙරෙනු ඇත.

03. කජු වගාවේ පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය

ශ්‍රී ලංකාවේ නිපදවන කජු මදවල රසවත් බව, විශාලත්වය හා ආවේණික වර්ණයෙන් යුක්ත වීම නිසා ලෝක වෙළඳපොල තුල අධික ඉල්ලුමක් ඇතිවී ඇත. එහෙත් වාර්ෂිකව නිෂ්පාදනය වන ලෙලිකජු මෙට්‍රික් ටොන් 10000-12000 ක පමණ වාර්ෂික අස්වැන්න මගින් මෙම අපනයන ධාරිතාවය ක්ෂණිකව ඉහළ නැංවීම දුෂ්කර වී ඇත. දේශීය මද පරිභෝජනයද ඉහළ ගොස් ඇත.

මීට අමතරව කජු මද කිලෝවක නිෂ්පාදන වියදම ඉහළයාම නිසා කජු මද කිලෝවක මිල රු. 2500/- ත් රු. 3800/- ත් අතර පරාසයක පවතී. මෙම කරුණු සැළකිල්ලට ගෙන කජු මද නිෂ්පාදනවල ගුණාත්මය හා ලාභය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත.

3.1 ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද භාවිතය

සංස්ථාව විසින් කුඩා පරිමාණ ව්‍යවසායකයන් සඳහා ප්‍රමිතිකරණය, අගය එකතු කිරීම හා ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද (Good Manufacturing Practices) භාවිතයෙන් නිෂ්පාදනවල තත්ත්වය ඉහළ නැංවීම, සෞඛ්‍යාරක්ෂිත නිෂ්පාදන ක්‍රමවේද භාවිතය, නව තාක්ෂණය සහිතව පිරිසැකසුම් ක්‍රියාවලිය නවීකරණය කිරීම, අඩු වියදම් විජලීකරණ යන්ත්‍ර භාවිතය හා නව ඇසුරුම් ක්‍රම හා නව නිෂ්පාදන සඳහා ව්‍යවසායකයන් උනන්දු කිරීම සිදුකෙරේ. මේ සඳහා නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පුහුණු මධ්‍යස්ථානය උපයෝගී කරගනු ලැබේ.

3.2 පුහුණු වැඩසටහන්

කුඩා පරිමාණ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ජාත්‍යන්තර ප්‍රමිති තත්ත්වයන් දක්වා ඉහළ නැංවීමට සංස්ථාවේ දායකත්වය ලබාදුන් අතර, වාර්ෂිකව පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන්නන් 50 ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇත. මෙම ඉදිරි වසර 03 තුල අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

පිරිසැකසුම් කර්මාන්තය ආරම්භ කරන්නන් හට අවශ්‍ය විදුලිබලයෙන් ක්‍රියාකරන කැපීමේ යන්ත්‍ර (Shelling machine) හා විජලීකරණ යන්ත්‍ර (Ovens) සංස්ථාවේ මැදිහත්වීම මත පහසුමිලට ලබාදීමේ වැඩසටහනක්ද ක්‍රියාක්මක කෙරෙන අතර, මෙය අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

3.3 <u>කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන්ගෙන් කජු මද මිලදී ගැනීම</u>

සංස්ථා වතුයායන් වලින් ලැබෙන ලෙලි කජු අස්වැන්නට අමතරව පිරිසැකසුම් කර්මාන්තශාලාවල අඛණ්ඩව වාර්ෂික නිෂ්පාදනය සිදුකිරීම සඳහා අවශ්‍ය කජු මද කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන්ගෙන් මිලදී ගැනීම පසුගිය වසර තුලදී සිදුකරන ලදී. වෙළඳපොල තරඟකාරී

තත්ත්වයන්ට මුහුණදීම සහ පිරිවැය අවමකිරීමේ පරමාර්ථයෙන් ගොවීන්ගෙන් ලෙලිකජු මිලදීගැනීම වෙනුවට කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන්ගෙන් කජුමද මිලදී ගැනීම සිදුකරන ලදී. ඉදිරි වර්ෂ 3 තුලදීද කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන්ගෙන් කජු මද මිලට ගැනීමට කටයුතු කරනු ලැබේ.

3.4 <u>කජු අතුරු නිෂ්පාදන ප්‍රවර්ධනය</u>

කජු අස්වැන්න මගින් ප්‍රධාන වශයෙන්ම ලෙලිකජු වෙන්කරගන්නා අතර කජු පුහුලන් ප්‍රයෝජනයට නොගෙන අපතේ යයි. මේ අනුව වාර්ෂිකව කජු පුහුලන් ටොන් 10000 කට අධික ප්‍රමාණයක් ප්‍රයෝජනයට නොගෙන විනාශ වී යයි. මෙම කජු පුහුලන් භාවිතකර Non Alcoholic Beverages ජෑම්, කෝඩියල් වැනි අතුරු නිෂ්පාදන සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම, පුහුණුව ලබාදීම සහ පෞද්ගලික අංශය සමඟ නිෂ්පාදන සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි.

4.0 <u>මානව සම්පත් සංවර්ධනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම</u>

4.1 මානව සම්පත් පුහුණු කිරීම හා සංවර්ධනය

කාර්ය මණ්ඩලයේ සියළුම තරාතිරම්වල නිලධාරීන්ගේ පුහුණුව හා සංවර්ධනය සඳහා අවශ්‍ය සේවාස්ථ පුහුණු සැසි පැවැත්වීමට කටයුතු සිදුකර ඇත. මෙමගින්කාර්ය ඵලදායිතාවය ඉහළ නැංවීමටත් ඔවුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීමටත්, නව දැනුම ලබාගැනීමටත් අවස්ථාව සැලසෙන අතර, ස්වයං පෙළඹවීම මගින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත් ඉඩප්‍රස්ථා සැලසේ. මෙම පුහුණු වැඩසටහන් ඉදිරි වර්ෂ 03 තුල අඛණ්ඩව සිදුකිරීමට සැලසුම් කර ඇත.

4.2 කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිසංවිධානය හා කාර්ය සාධන ඇගයීම

සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල ජාලය සඳහා පරිගණක හා ෆැක්ස් යන්ත්‍ර ලබාදී ඇත. ඒ අනුව අන්තර්ජාල පහසුකම් සහිතව සන්නිවේදන කටයුතු නවීකරණය කර ඇත. වර්තමාන සංවර්ධන ක්‍රියාවලියට අනුරූප වන පරිදි සංස්ථාවේ කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම සිදුකල අතර , ඒ අනුව බඳවාගැනීමේ හා උසස් වීමේ පටිපාටිය සංශෝධනය කිරීමටත් අවශ්‍ය පියවර ගෙන ඇත. මෙමගින් කාර්ය මණ්ඩල ව්‍යුහය තුල කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය මුලිකාංග සහිතව සංස්ථාවේ ඉදිරි වසර කිහිපය තුල අභියෝග වලට මුහුණදීම සඳහා මෙම ව්‍යුහාත්මක වෙනස්කම් උපයෝගී කරගනු ඇත. සියළුම තරාතිරම්වල කාර්ය සාධනය ඇගයීම් සිදුකිරීමටද අවශ්‍ය පියවර ගෙන ඇත.

කාර්ය සාධනය පිළිබඳ වර්ෂ 05 ක සාරාංශය

විස්තරය		2017	2016	2015	2014	2013
01	සහනාධාර යෝජනා ක්‍රමය යටතේ වගා කරන ලද කජු අක්කර ප්‍රමාණය	සහනාධාර වැඩසටහන 3215 ගෙවතු වගාව 1285 එකතුව 4500	4500	4500	4200	4350
02	සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන ගොවි පවුල් සංඛ්‍යාව	14932	3298	3750	4397	4008
03	නිෂ්පාදනය කරන ලද පැළ ගණන	බද්ධ පැළ 328456 බීජ පැළ 105480 එකතුව 433936	බද්ධ පැළ 209125 බීජ පැළ 78500 එකතුව 287625	බද්ධ පැළ 218373 බීජ පැළ 80000 එකතුව 298373	බද්ධ පැළ 465979 බීජ පැළ 80000 එකතුව 545979	බද්ධ පැළ 468714 බීජ පැළ 88529 එකතුව 557243
04	එක්රැස් කරන ලද මව්බීජ සංඛ්‍යාව	560000	330103	600000	1300000	1100000
05	එක්රැස් කරන ලද රිකිලි ප්‍රමාණය	200000	264000	310000	200000	300000
06	ලබාගත් අස්වැන්න	66.4	109	106	115	72
07	සංස්ථා වතුයායන්වල නව වගාව	433	116.25	250	400	252.5
08	වරලත් අලෙවිසැල් සංඛ්‍යාව	56	51	39	18	11
09	තාක්ෂණ හුවමාරු වැඩසටහන් , පළිබෝධ පාලනය සහ පසු අස්වනු තාක්ෂණය යටතේ පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	197	168	126	223	216
10	පුහුණු කරන ලද ගොවීන් සංඛ්‍යාව	3574	1833	2200	2230	2197
11	ආනයනය කරන ලද කජු ප්‍රමාණය (මෙ.ටොන්)	ලෙලි කජු 2108.22 කජු මද 160.82	ලෙලි කජු 1622 කජු මද 263	ලෙලි කජු 2490 කජු මද 565	ලෙලි කජු 755.89 කජු මද 311.57	ලෙලි කජු 16.33 කජු මද 159.6

විස්තරය		2017	2016	2015	2014	2013
12	කජු ආනයන බලපත්‍ර නිකුත් කරන ලද මෙ.ටොන් ප්‍රමාණය	6000	2910	2900	855	-
13	කජු අපනයනය කරන ලද මෙ.ටොන් ප්‍රමාණය	59.04	57.64	105.66	129.4	51.0
14	කජු අපනයනය කරන ලද වටිනාකම (රු.මි)	143.51	99.98	174.06	185.8	77.0
15	ගොවීන්ගෙන් ලෙලි කජු සහ කජු මද මිලදී ගැනීම (මෙ.ටොන්)	ලෙලි කජු 2108.22 කජු මද 160.82	ලෙලි කජු 2108.22 කජු මද 160.82	ලෙලි කජු 2108.22 කජු මද 160.82	ලෙලි කජු 2108.22 කජු මද 160.82	ලෙලි කජු 2108.22 කජු මද 160.82
16	අගය එකතු කරන ලද කජු මද විකුණූ ප්‍රමාණය (මෙ.ටොන්)	27.80	30.94	27.80	26.32	41.03
17	අගය එකතු කරන ලද කජු මද විකුණූ වටිනාකම	87.96	84.59	66.65	64.0	78.8

ශ්‍රී ලංකා කපු සංස්ථාව
2017.12.31 දිනට ඒකාබද්ධ ශේෂ පත්‍රය

2016.12.31 රු.		සටහන	රු.	රු.
	:වත්කම්			
	ජංගම නොවන වත්කම්			
100,868,528.94	දේපළ පිරියත හා උපකරණ	01	89,362,959.50	
29,302,731.09	ඵල දරණ වගා නඩත්තු වියදම්	02	22,870,089.39	
41,362,272.10	ඵල නොදරණ වගා නඩත්තු වියදම්	03	50,446,121.30	
949,324.48	අනෙකුත් කුඩා ව්‍යාපෘති	04	619,747.39	
-	කෙරීගෙන යන වැඩ - ප්‍රාග්ධන		1,726,012.98	
172,482,856.61	**මුළු ජංගම නොවන වත්කම්**			165,024,930.56
	ජංගම වත්කම්			
28,916,492.36	**තොග**	05	24,940,401.02	
20,797,900.64	**වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ**	06	19,597,015.87	
4,840,932.10	**තැන්පතු අත්තිකාරම් හා පූර්ව ගෙවීම්**	07	3,809,621.50	
7,874,272.04	**මුදල් සහ මුදල් සමාන දෑ**	08	5,805,582.02	
62,429,597.14	**මුළු ජංගම වත්කම්**			54,152,620.41
234,912,453.75	**මුළු වත්කම්**			**219,177,550.97**
	ස්කන්ධ සහ වගකීම්			
	ස්කන්ධ			
40,000,000.00	**මුලික ප්‍රාග්ධනය**		40,000,000.00	
123,860,520.72	**රාජ්‍ය ප්‍රදාන**		143,996,351.45	
18,529,864.26	**අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන**	09	18,142,815.79	
17,441,846.85	**ප්‍රාග්ධන සංචිත**	10	17,441,846.85	
(27,975,179.12)	**ලාභ අලාභ ගිණුම**		(70,310,901.06)	
171,857,052.71	**මුළු ස්කන්ධ**			149,270,113.03
	ජංගම නොවන වගකීම්			
40,060,261.50	**පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම්**		27,334,760.00	
3,500,000.00	**දිගුකාලීන ණය**	11	3,500,000.00	
43,560,261.50	**මුලුළු ජංගම නොවන වගකීම්**		30,834,760.00	
	ජංගම වගකීම්			
19,495,139.54	**වෙළෙඳ ණයහිමියෝ සහ ගෙවිය යුතු අනෙකුත් දෑ**	12	39,072,677.94	
19,495,139.54	**මුලුළු ජංගම වගකීම්**			69,907,437.94
234,912,453.75	**මුළු ස්කන්ධ සහ වගකීම්**			**219,177,550.97**

ධම්සිරි බණ්ඩාර කරුණාරත්න	මිරිඇල්ල ඩබ්.එම්. බණ්ඩාරතිලක	ඩී.කේ. ජයකොඩිආරච්චි	එම්.ටී.එස්.කේ.පීරිස්
සභාපති	උප සභාපති	සාමාන්‍යාධිකාරී	සහකාර සාමාන්‍යාධිකාරී - මුදල්

ගිණුම් සටහන්

(1) ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාල මූල්‍ය ප්‍රකාශන 2018.02.27 දින අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලදී.

(2) ව්‍යාපාර ස්වභාවය සහ ප්‍රධාන ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා කජු සංස්ථාව කෘෂිකාර්මික නිෂ්පාදන කටයුතුවල යෙදෙන අතර එහි ප්‍රධාන ක්‍රියාකාරකම් පහතින් සඳහන් කර ඇත.

- වතුයායන්වල කජු පැළ වගා කිරීම සහ ලෙලි කජු නිෂ්පාදනය.
- සංස්ථා බීජ උද්‍යානවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය.
- සංස්ථා වානිජ පැළ තවාන්වල බද්ධ සහ බීජ පැළ නිෂ්පාදනය.
- කජු වගාව ව්‍යාප්ත කිරීම සඳහා දිස්ත්‍රික්ක 18 ක් ආවරණය කරමින් ගොවි ඉඩම් සඳහා සහනාධාර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- පිරිසැකසුම් මධ්‍යස්ථානවල කජු මඳ නිපදවීම සහ අගය එකතු කිරීම.
- කජු පුහුලන් භාවිතයෙන් වයින් නිෂ්පාදනය.
- අගය එකතු කරන ලද කජු නිෂ්පාදන සංස්ථා අලෙවිසැල්වල, වරලත් අලෙවිසැල්වල සහ වෙනත් ආයතනවල අලෙවි කිරීම.
- කජු වගාව සහ පිරිසැකසුම් තාක්ෂණය සම්බන්ධයෙන් පර්යේෂණ හා සංවර්ධන කටයුතු පවත්වාගෙන යාම සහ පුහුණුව ලබාදීම.

(3) සංස්ථාවේ හිටපු අලෙවි හා පිරිසැකසුම් කළමනාකරු විසින් ඔහුව අනුමිත ලෙස සේවයෙන් පහ කර ඇති බව නිමිත්ත ලෙස ගෙන ඒ සම්බන්ධයෙන් වන්දියක්

ඉල්ලුම් කරමින් සංස්ථාවට එරෙහිව කොළඹ 01, කම්කරු විනිශ්චයාධිකාරයේ නඩු පවරා ඇත. වාර්තා කරන දිනට එම නඩුවේ අවසන් තීන්දුවක් ප්‍රකාශයට පත්කර නොමැති අතර සාධාරණ ඇස්තමේන්තුවක් සපයාගත නොහැකි වීම නිසා එම වන්දි ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රතිපාදනයක් ගිණුම්පොත්වල සිදුකර නැත.

(4) මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා පදනම්කර ගත් මිනුම්

මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ අදාල මිනුම් ගිණුම් සටහන් වල අවශ්‍ය අවස්ථාවන් වලදී අනාවරණය කොට ඇත.

<u>ශ්‍රී ලංකා කජු සංස්ථාව</u>

පදනම් කරගත් ගිණුම් ප්‍රතිපත්ති - 2017

01. පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මත ගිණුම් පිළියෙල කර ඇත.

02. ස්ථාවර වත්කම් සරළ මාර්ග ක්‍රමය මත ක්ෂය කරන ලදී. වර්ෂය තුල මිලට ගත් වත්කම් ගත් දිනය පදනම් කරගෙන ක්ෂය ගණනය කරන ලදී. වර්ෂය තුල නිම කරන ලද ගොඩනැගිලි නිම කරන ලද දිනය පදනම් කරගැනීමෙන් නොව මුළු වර්ෂය සඳහාම ක්ෂය ගණනය කරන ලදී.

ක්ෂය කිරීමේ ප්‍රතිශත පහත සඳහන් පරිදි වේ

මෝටර් වාහන	20%
යන්ත්‍ර සූත්‍ර	10%
මෙවලම් හා උපකරණ	10%
කාර්යාලීය උපකරණ	10%
නළ ලිං/වගා ලිං	10%
ලී බඩු උපකරණ සහ සවිකිරීම්	06%
ස්ථිර ගොඩනැගිලි	03%
අර්ධ ස්ථිර ගොඩනැගිලි	33 1/3%

03. දේපල පිරියත සහ උපකරණ ලෙස හඳුනාගත් වත්කම් පිරිවැයට ගිණුම්ගත කර ඇත.

දේපල පිරියත සහ උපකරණ වල අගය ප්‍රත්‍යාගණන වටිනාකම මත සමුච්චිත ක්ෂය හා හානිකරන ලද අලාභ අඩුකර දක්වා ඇත.

04. පහත සඳහන් පදනම මත තොග ගණනය කරන ලදී

කජු මද	;	ශුද්ධ විකුණුම් මිලෙන්
කජු ඇට	;	සහතික කළ වෙනස් වන මිල/වෙළෙඳ පොළ මිල
ගව සහ බැටළු	;	ඒ ඒ පලාත්වල වෙළෙඳ මිල/ජීව බර අනුව
පොල්	;	ශුද්ධ විකුණුම් මිල
අනෙකුත් සියළුම තොග	;	පිරිවැයට ගණනය කරන ලදී.

05. ප්‍රධාන කාර්යාලීය වියදම් පිරිවැය මධ්‍යස්ථාන අතර එහි අන්තර්ගත මුළු වැටුප් වියදමට අදාලව බෙදා හරින ලදී.

06. වතුයායන්හි සාමාන්‍ය වියදම් ඵල දරණ සහ ඵල නොදරණ ප්‍රදේශ, පැලතවාන් සහ සත්වපාලනය අතර බෙදීම එම ප්‍රදේශ සඳහා වැයවූ සත්‍ය කම්කරු දින ගණනේ අනුපාතය අනුව බෙදා හරින ලදී.

07. මේරූ ප්‍රදේශවල ක්‍රමක්ෂය කිරීම වර්ෂයකට 5% බැගින් ගණනය කරන ලදී.

08. බොල් ණය සහ අඩමාන ණය වෙන් කිරීම මුළු ණය ගැතියන්ගෙන් 3.53% බැගින් ගණනය කර ඇත.වෙන් කිරීම් ගිණුමේ වෙනස වර්ෂය තුල බොල් ණය කපා හැරීම සඳහා මාරු කරන ලදී.

09. පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම පාරිතෝෂික දීමනා පනතේ සඳහන් පරිදි සේවය කරන ලද සම්පූර්ණ වර්ෂ ගණනකට අනුව ගණනය කරන ලදී. පාරිතෝෂික හිමිකම් ලැබීම සඳහා පනතේ සඳහන් අවම සේවා කාලය ගිණුම් වර්ෂය තුලදී සම්පූර්ණවූ අයගේ සේවා පිරිවැය ආදායම් ගිණුමට හර කර ඇත.

10. ලැබූ හා ලැබිය යුතු දැවල වටිනාකම මත ආදායම ගිණුම්ගත කර ඇත. පහත සඳහන් දැ සැලකිල්ලට ගෙන භාණ්ඩ විකිණීමේ ආදායම හඳුනාගෙන ඇත.

- ආයතනය අවදානම හා ප්‍රතිලාභ යන දෙකම ගැණුම්කරුට ලබාදේ.

- ආයතන කළමනාකාරිත්වයේ මැදිහත්වීමක් විකුණන භාණ්ඩවල හිමිකාරිත්වයට හෝ කාර්යක්ෂම පාලනයක් තබා ගැනීම සඳහා මැදිහත් නොවේ.
- ආදායම විශ්වාසනීය ලෙස හඳුනාගත හැකි වීම.
- ගණුදෙනු හා අදාල ආර්ථික ප්‍රතිලාභයන් ආයතනයට ගලායා හැක.
- ගණුදෙනුවට අදාල වු හෝ අදාල විය හැකි පිරිවැය විශ්වාසනීය ලෙස අගය කිරීම.

11. ප්‍රාග්ධන වත්කම් හි ක්ෂයවීම් හා ක්‍රමක්ෂය ලෙස ගිණුම් පොත්වලට ඇතුලත් කර ඇති සත්‍ය වටිනාකම්, අදාල ප්‍රාග්ධන වත්කම්වලින් කපා හැරීමෙන් අනතුරුව ඊට සමාන වටිනාකමක් ප්‍රාග්ධන ප්‍රදානවලින් ඉවත් කර ගිණුම්පොත් වල ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

12. මෝටර් වාහන ප්‍රත්‍යාගණනය 2009.01.01 දින සිට බලපැවැත්වෙන දිනය ලෙස නිශ්චය කරන අතර, පිළිගත් රාජ්‍ය ආයතනයක කාර්මික ඉංජිනේරුවරයෙකුගේ මුලිකත්වයෙන් යුතු ස්වාධීන කොමිසමක් මඟින් කරන ලදී.

13. බද්ධ පැළ සහ බීජ පැළ නිෂ්පාදනයට අදාල පරිපාලන වියදම් සේවා සහ වානිජ අංශ අතර, නිෂ්පාදිත සත්‍ය පැළ හා බෙදා හරින ලද පැළ පදනම් කර ගෙන කර ඇත.

ශ්‍රී ලංකා කපු සංස්ථාව
2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශේෂ පත්‍රයට අදාල සටහන්

සටහන් 01
දේපල පිරියත සහ උපකරණ:

විස්තරය	පිරිවැය/ප්‍රත්‍යාගණන අගය 2017.01.01 (රු.)	අදාල වසරේ වත්කම් එකතුවීම්/ ප්‍රත්‍යාගණනය (රු.)	අදාල වසරේ වත්කම් එත්කිරීම්/ විකුණුම් (රු.)	වත්කමේ වර්තමාන පිරිවැය/ප්‍රත්‍යාගණන වටිනාකම (රු.)	2017.12.31දිනට සමුච්චිත ක්ෂය (රු.)	2017.12.31 දිනට ලියා හරින ලද අගය (රු.)
සින්නක්කර ඉඩම්	25,786,722.37	870,534.17	-	26,657,256.54	-	26,657,256.54
ස්ථාවර ගොඩනැගිලි	44,914,437.15	1,880,155.62	1,116,640.00	45,677,952.77	18,457,443.88	27,220,508.89
අර්ධ ස්ථිර ගොඩනැගිලි	440,411.00	-	-	440,411.00	326,457.24	113,953.76
වාහන	99,987,430.84	1,320,265.00	-	101,307,695.84	79,127,417.38	22,180,278.46
යන්ත්‍ර සූත්‍ර	16,425,496.98	524,050.00	-	16,949,546.98	12,108,350.72	4,841,196.26
මෙවලම් හා උපකරණ	9,035,400.74	44,694.00	-	9,080,094.74	7,598,905.27	1,481,189.47
කාර්යාලීය උපකරණ	10,924,321.49	691,532.60	-	11,615,854.09	9,052,234.46	2,563,619.63
ලී බඩු හා සවිකිරීම්	7,097,233.32	112,104.00	-	7,209,337.32	4,736,055.84	2,473,281.48
නළ ළිං	958,383.50	-	52,447.50	905,936.00	582,286.59	323,649.41
වගා ළිං	1,180,506.40	153,174.00	-	1,333,680.40	434,479.42	899,200.98
වැව්	608,824.62	-	-	608,824.62	-	608,824.62
	217,359,168.41	**5,596,509.39**	**1,169,087.5**	**221,786,590.30**	**132,423,630.80**	**89,362,959.50**

ශ්‍රී ලංකා කජු සංස්ථාව
2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශේෂ පත්‍රයට අදාල සටහන්

සටහන් 02:

එල දරණ වගාව	- කජු (සටහන 2 අ)	20,682,696.05
	- පොල් (සටහන 2 ආ)	2,187,393.34
		22,870,089.39

සටහන 02 (අ)

එල දරණ වගාව - කජු

වතුයාය	පිරිවැය 2017.01.01 (රු.)	2017.12.31 දිනට සමුච්චිත ක්ෂය	ලියා හරින ලද අගය 2017.12.31 (රු.)
හාඩි වතුයාය	2,736,310.00	1,888,661.61	847,648.39
කමන්දළුව වතුයාය	15,520,696.93	11,654,069.39	3,866,627.54
පුත්තලම වතුයාය	9,669,098.41	4,698,205.55	4,970,892.86
එළුවන්කුලම බීජ උද්‍යානය	13,933,185.28	10,265,556.34	3,667,628.94
විලච්චිය ශාක අභිජනන මධ්‍යස්ථානය	655,569.86	195,962.78	459,607.08
ඇල්කඩුව ශාක අභිජනන මධ්‍යස්ථානය	5,806,871.57	1,406,553.77	4,400,317.80
මහඔය ශාක අභිජනන මධ්‍යස්ථානය	1,150,848.05	230,169.60	920,678.45
මොණරාගල ශාක අභිජනන මධ්‍යස්ථානය	1,936,618.75	387,323.76	1,549,294.99
	51,409,198.85	**30,726,502.80**	**20,682,696.05**

සටහන 02 (ආ)

එල දරණ වගාව - පොල්

වතුයාය	පිරිවැය 2047.01.01 (රු.)	2017.12.31 දිනට සමුච්චිත ක්ෂය	ලියා හරින ලද අගය 2017.12.31(රු.)
හාඩි වතුයාය	1,777,787.09	636,818.39	1,140,968.70
කමන්දළුව වතුයාය	2,437,612.22	1,445,185.65	992,426.57
පුත්තලම වතුයාය	431,998.76	378,000.69	53,998.07
	4,647,398.07	**2,460,004.73**	**2,187,393.34**

ශ්‍රී ලංකා කජු සංස්ථාව

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශේෂ පත්‍රයට අදාල සටහන්

<u>සටහන් 03</u>

එල නොදරණ වගාව - කජු

	(සටහන 3 අ)	45,725,156.44
. - පොල්	(සටහන 3 ආ)	4,720,964.86
		50,446,121.30

<u>සටහන් 03 (අ)</u>

නොමේරූ ප්‍රදේශ :(කජු)

<u>වතුයාය</u>	<u>2017.12.31 දිනට පිරිවැය</u>
හාඩි වතුයාය	2,431,679.09
කමන්දළුව වතුයාය	3,068,537.81
පුත්තලම වතුයාය	6,864,655.88
එළුවන්කුලම බීජ උද්‍යානය	772,390.43
මාන්ක(ර්)නි වතුයාය	1,410,672.56
ඇල්කඩුව ශාක අභිජනන මධ්‍යස්ථානය	156,382.00
මහඔය බීජ උද්‍යානය	721,564.25
මොණරාගල බීජ උද්‍යානය	364,280.30
පර්යේෂණ හා සංවර්ධන	1,647,839.85
නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය	135,360.40
ඔයාමඩුව ශාඛ අභිජනන මධ්‍යස්ථානය	10,978,043.14
විලච්චිය ශාක අභිජනන මධ්‍යස්ථානය	21,783.98
කොණ්ඩච්චි ශාක අභිජනන මධ්‍යස්ථානය	16,993,081.39
තිරියාය ශාක අභිජනන මධ්‍යස්ථානය	158,885.36
	45,725,156.44

ශ්‍රී ලංකා කජු සංස්ථාව

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශේෂ පත්‍රයට අදාල සටහන්

සටහන් 03 (ආ)
ඵල නොදරණ වගාව - පොල්

වතුයාය	2017.12.31 දිනට පිරිවැය
හාඩි වතුයාය	1,748,184.58
කමන්දළුව වතුයාය	1,124,168.53
පුත්තලම වතුයාය	630,182.49
ඔයාමඩුව ශාඛ අභිජනන මධ්‍යස්ථානය	1,218,429.26
	4,720,964.86

සටහන් 04
අනෙකුත් කුඩා ව්‍යාපෘති

ව්‍යාපෘතිය	2017.12.31 දිනට පිරිවැය
තේක්ක පැළ ව්‍යාපෘතිය	482,874.09
තල ව්‍යාපෘතිය	40,000.00
කෙසෙල් හා දෙහි ව්‍යාපෘතිය	10,800.00
තිබ්බටු ව්‍යාපෘතිය	86,073.30
	619,747.39

සටහන් 05
ජංගම වත්කම්

තොග	2017.12.31 දිනට පිරිවැය
විවිධ	5,059,052.46
වයින්	160,912.45
කජු මද	4,841,901.20
කජු ඇට	12,024,540.68
පැල	2,148,676.44
ඇසුරුම් ද්‍රව්‍ය	705,317.79
	24,940,401.02

ශ්‍රී ලංකා කජු සංස්ථාව

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශේෂ පත්‍රයට අදාල සටහන්

සටහන් 06

වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ

		2017.12.31 දිනට පිරිවැය
වෙළඳ ණයගැතියෝ	3,937,304.10	
අඩු කළා- බොල්ණය වෙන් කිරීම	138,986.00	3,798,318.10
විවිධ ණයගැතියෝ	17,742,289.77	
හානි වීම් වලින් වන අලාභ	1,943,592.00	15,798,697.77
		19,597,015.87

සටහන් 07

තැන්පතු, අත්තිකාරම් සහ පෙර ගෙවුම්

	2017.12.31 දිනට පිරිවැය
අත්තිකාරම්	80,890.00
පෙර ගෙවුම්	149,848.00
තැන්පතු	3,578,883.50
	3,809,621.50

සටහන් 08

මුදල් හා මුදල් සමාන දෑ

	2017.12.31 දිනට පිරිවැය
මුදල් - මාර්ගස්ථ	222,180.00
මුදල්-අත ඉතිරි හා බැංකු ඉතිරි	5,583,402.02
එකතුව	**5,805,582.02**

සටහන් 09

අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන	2017.12.31 දිනට පිරිවැය
උතුරු නැගෙනහිර වෙරළබඩ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය	6,343,881.26
අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යාංශය	1,612,451.80
සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය	10,186,482.73
	18,142,815.79

ශ්‍රී ලංකා කපු සංස්ථාව

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශේෂ පත්‍රයට අදාල සටහන්

<u>සටහන් 10</u>

<u>ප්‍රාග්ධන සංචිත</u>

ප්‍රත්‍යාගණන සංචිතය - වාහන	16,929,116.63
අනෙකුත් ප්‍රාග්ධන සංචිත	512,730.22
	17,441,846.85

<u>සටහන් 11</u>

<u>දිගු කාලීන ණය</u>

වී අලෙවි මණ්ඩලය	3,500,000.00
	3,500,000.00

<u>සටහන් 12</u>

<u>ජංගම වගකීම්</u>

විවිධ ණයහිමියෝ	28,294,917.54
උපචිත වියදම්	10,777,760.40
එකතුව	**39,072,677.94**

ශ්‍රී ලංකා කජු සංස්ථාව

වාණිජ අංශය

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ලාභ අලාභ ගිණුම

2016.12.31 (රු.)		2017.12.31 (රු.)
	විකුණුම්/පිරිවැටුම	
86,194,216.09	කජු මද	90,515,369.48
2,121,515.00	බීජ කජු ඇට	2,866,000.00
5,210,800.00	කජු පැල	6,631,300.00
1,425,600.50	පොල්	1,321,899.23
(46,496.00)	ආපසු එවුම්	(383,486.20)
94,905,635.59	**ශුද්ධ විකුණුම්**	**100,951,082.51**
	අඩුකළා: විකුණුම් පිරිවැය	
(1,868,861.98)	තොග අඩු/වැඩිවීම්	1,635,651.00
741,976.96	තවාන් වියදම්	1,612,703.11
38,613,263.18	කජු මද නිෂ්පාදන පිරිවැය/පොදුකාර්ය	45,034,158.52
24,383,333.74	ඵල දරණ වගා නඩත්තු වියදම්	24,730,199.52
6,777,772.26	ඵල දරණ වගා සෘජු වියදම්	7,169,800.48
68,647,484.16	මුළු විකුණුම් පිරිවැය	80,182,512.63
26,258,151.43	**දළ ලාභය:**	**20,768,569.88**
	අඩුකළා: අනෙකුත් වියදම්	
19,992,240.51	පරිපාලන වියදම්(පිරිසැකසුම් සහ තවාන්)	20,603,576.87
19,992,240.51		20,603,576.87
6,265,910.92	**ලාභ (අලාභ) ක්‍රමක්ෂය කිරීමට පෙර**	**164,993.01**
3,351,365.57	ක්‍රමක්ෂය	2,473,266.69
2,914,545.35	**ලාභ(අලාභ) ක්‍රමක්ෂය කිරීමට පසු**	**(2,308,273.68)**
352,698.68	ලාභ/(අලාභ) වයින්	239,778.90
105,000.00	ලාභ/(අලාභ) පිරිසැකසුම් උපකරණ	160,000.00
(204,645.68)	ලාභ/(අලාභ) පැපොල් ව්‍යාපෘතිය	(306,544.66)
58,407.55	ලාභ/(අලාභ) පුහුණු වැඩසටහන්	(11,831.45)
-	ලාභ/(අලාභ)තිබ්බටු ව්‍යාපෘතිය	(60,198.60)
-	ලාභ/(අලාභ)වෙනත් ව්‍යාපෘති	4,681,795.00
3,226,005.90	**ක්‍රියාත්විතයෙන් ලත් ශුද්ධ ලාභ/(අලාභ)**	**2,394,725.51**
-	**අනෙකුත් ආදායම්**	-
16,922,573.08	රාජ්‍ය ප්‍රදාන (පුනරාවර්තන)	18,700,200.00
8,752,506.76	අතිරික්ත/ඌණ වෙන්කිරීම් සඳහා ගැලපුම්	9,593,187.00
1,563,437.62	පොලී ආදායම්	329,352.28
17,596,700.93	වෙනත් ආදායම්	6,816,908.27
2,717,036.82	ක්‍රමක්ෂය-වෙනත් පාර්ශවයන්ගෙන් ලත් ප්‍රදාන	2,717,036.82
47,552,255.21	**මුළු අනෙකුත් ආදායම්**	**38,156,684.37**
	අනෙකුත් වියදම්:	
19,148,189.25	පරිපාලන වියදම් (ප්‍රධාන කාර්යාලය)	18,288,559.7
-	ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ අලාභය	896,103.60
-	ලියාහරින ලද අගය- ඵලදරණ කජු වගාව	5,024,718.24
19,148,189.25	**මුළු අනෙකුත් වියදම්**	**24,209,381.60**
31,630,071.86	ශුද්ධ ලාභය	16,342,028.28

ශ්‍රී ලංකා කජු සංස්ථාව
සේවා අංශය
2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම

2016.12.31 රු.				රු.
	ආදායම			
21,870,362.74	රාජ්‍ය ප්‍රදාන	ප්‍රාග්ධන	ප්‍රවර්තන වසර	24,589,778.18
2,760,588.10			ක්‍රමක්ෂය - අනෙකුත් වත්කම්	2,884,391.09
3,834,000.00			කැබ් රථ - 03	3,834,000.00
31,077,426.92			පුනරාවර්තන	35,299,800.00
	වෙනත් ආදායම්			
220,800.00		අතිරික්ත වෙන්කිරීම් සඳහා ගැලපුම්	189,038.00	
2,056.42		ව්‍යාප්ති සේවා	3,870.00	
-		ඔයාමඩුව ශාඛ අභිජනන මධ්‍යස්ථානය	139,875.00	
-		කොණ්ඩච්චි ශාක අභිජනන මධ්‍යස්ථානය	334,356.06	
352,400.00		පර්යේෂණ හා සංවර්ධන	1,030,875.00	1,698,014.06
60,117,634.18	**මුළු ආදායම:**			**68,305,983.33**
	අඩු කළා:			
	වියදම්			
35,164,655.48	ප්‍රධාන කාර්යාලය		34,522,759.20	
21,870,362.74	ප්‍රාග්ධන දීමනා යටතේ		24,589,778.18	
60,540,353.94	ව්‍යාප්ති සේවා		58,896,287.71	
2,816,646.19	මධ්‍යම පැල තවාන්		1,570,956.24	
4,087,590.92	පර්යේෂණ හා සංවර්ධන		3,616,873.22	
918,419.76	ඔයාමඩුව ශාඛ අභිජනන මධ්‍යස්ථානය		1,295,658.36	
2,875,088.50	කොන්ඩච්චි ශාඛ අභිජනන මධ්‍යස්ථානය		2,491,420.64	
128,273,117.53	**මුළු වියදම:**			126,983,733.55
	වර්ෂය තුල ආදායම ඉක්මවූ වියදම			
(68,155,483.35)	අවසාන ඒකාබද්ධ ලාභ අලාභ ගිණුමට මාරු කලා			**(58,677,750.22)**

ශ්‍රී ලංකා කජු සංස්ථාව

ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශය

31.12.2016	2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සම්පූර්ණ ආදායම් විස්තරය		
(රු.)			(රු.)
31,630,071.86	වානිජ අංශයෙන් ලද ශුද්ධ ආදායම		16,342,028.28
(68,155,483.35)	ප්‍රවර්ථන වසර සඳහා ආදයම ඉක්මවු වියදම -සේවා අංශය		(58,677,750.22)
(36,525,411.49)			**(42,335,721.94)**
8,550,232.37	ලාභය පහළට ගෙන ගියා	(27,975,179.12)	
8,550,232.37			(27,975,179.12)
(27,975,179.12)	ලාභය ඉදිරියට ගෙන ගියා		**(70,310,901.06)**

<u>ශ්‍රී ලංකා කජු සංස්ථාව</u>

මුදල් ප්‍රවාහ ප්‍රකාශය:

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2016.12.31	2017.12.31 දිනෙන් අවසන් වර්ෂය		
	මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
(36,525,411.49)	**වර්ෂය තුල ඉපයූ ශුද්ධ අලාභය**		(42,335,721.94)
	මුදල් චලනයන් නොවූ අයිතමයන් සඳහා ගැලපීම්		
16,687,047.08	කෂය වීම්	16,153,527.73	
3,505,738.91	ක්‍රමක්ෂය	2,627,640.03	
394,830.26	පාරිතෝෂිත දීමනා සඳහා වෙන් කිරීම	(337,498.50)	
317,055.04	බොල්ණය සඳහා ලියා හැරීම හෝ වෙන් කිරීම	357,280.00	
(8,752,506.76)	පාරිතෝෂික සඳහා අතිරික්ත වෙන්කිරීම්	(9,593,187.00)	
-	ස්ථාවර වත්කම් හුවමාරුවෙන් වූ අලාභය	948,551.10	
-	එල දරණ වගාව ලියා හැරිම	5,024,718.24	
(387,048.47)	වෙනත් පාර්ශවයන්ගෙන් ලත් ප්‍රදාන	(387,048.47)	
-	අනෙකුත් කුඩා ව්‍යාපෘති ලියා හැරිම	329,577.09	
(31,020,950.84)	ප්‍රාග්ධන දීමනා ක්‍රමක්ෂය	(33,864,169.27)	
			(18,740,609.05)
(55,781,246.27)	කාරක ප්‍රාග්ධනයේ වෙනසට පෙර මෙහෙයුම් ලාභය/පාඩුව		(61,076,330.99)
	<u>කාරක ප්‍රාග්ධන වෙනස්වීම්</u>		
1,214,314.30	තොගය - (වැඩිවීම)/අඩුවීම	3,976,091.34	
3,295,587.21	ණය ගැතියෝ - (වැඩිවීම)/අඩුවීම	843,604.77	
(553,536.89)	අත්තිකාරම් සහ පෙර ගෙවුම් - (වැඩිවීම)/අඩුවීම	1,031,310.60	
4,633,945.04	ණය හිමියෝ - වැඩිවීම/(අඩුවීම)	15,382,137.84	
(2,752,030.19)	උපචිත වියදම් - වැඩිවීම/(අඩුවීම)	4,195,400.56	
5,838,279.47			25,428,545.11
(49,942,966.80)			(35,647,785.88)
(4,052,692.13)	පාරිතෝෂිත ගෙවීම්		(2,794,816.00)
(53,995,658.93)	මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(38,442,601.88)**

ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

(7,347,504.56)	ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(5,596,509.39)	
-	කෙරීගෙන යන ප්‍රාග්ධන වියදම	(1,726,012.98)	
(9,485,785.15)	නව වගා සඳහා ආයෝජනය කිරීම	(10,303,565.77)	
(143,184.75)	වෙනත් කුඩා ව්‍යාපෘති සඳහා ආයෝජනය	-	
(16,976,474.46)			(17,626,088.14)
(70,972,133.39)	ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		(56,068,690.02)
	මූල්‍ය ක්‍රියාකාරම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
40,000,000.00	රාජ්‍ය ප්‍රදාන		54,000,000.00
(30,972,133.39)	වර්ෂය තුලදී මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/අඩුවීම		(2,068,690.02)
38,846,405.43	වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන් 01)		7,874,272.04
7,874,272.04			**5,805,582.02**

(සටහන 01)	2016.01.01 දිනට	2016.12.31 දිනට
අත ඉතිරි සහ බැංකු ඉතිරි මුදල්	7,851,472.04	5,583,402.02
මාර්ගස්ථ මුදල්	22,800.00	222,180.00
	7,874,272.04	**5,805,582.02**

	ශ්‍රී ලංකා කජු සංස්ථාව 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය										
2016.12.31	වෙනස්වීම්	මුලික ප්‍රාග්ධනය	රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන	ප්‍රාග්ධන ප්‍රධාන උතුරු නැගෙනහිර වෙරළබඩ ප්‍රජා.සං. වැඩසටහන	ප්‍රාග්ධන ප්‍රධාන අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යාංශය	ප්‍රත්‍යා ගණන සංචිතය	අනෙකුත් ප්‍රාග්ධන සංචිත	ප්‍රදාන සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය	ලාභා ලාභ ගිණුම	එකතුව
199,790,463.51	2016. 01.01 දිනට ශේෂය	40,000,000.00	123,860,520.72	6,569,892.91	1,612,451.80	16,929,116.63	512,730.22	10,347,519.55	(27,975,179.12)	171,857,052.71
40,000,000.00	වර්ෂ තුලදී ප්‍රධාන	-	54,000,000.00	-	-	-	-	-	-	54,000,000.00
(31,407,999.31)	ලාභ අලාභ ගිණුමට මාරු කිරිම	-	(33864169.27)	(226,011.65)	-	-	-	(161,036.82)	-	(34,251,217.74)
(36,525,411.49)	කාල පර්ච්චේදය සඳහා ශුද්ධ ලාභය/ අලාභය	-	-	-	-	-	-	-	(42,335,721.94)	(42,335,721.94)
171,857,052.71	2017 12.31 දිනට ශේෂය	**40,000,000.00**	143,996,351.45	**6,343,881.26**	**1,612,451.80**	**16,929,116.63**	**512,730.22**	**10,186,482.73**	(70,310,901.06)	149,270,113.03

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. ජීඑල්/සී/එස්එල්සීසී/1/17/11   ඔබේ අංකය / உமது இல. / Your No.   දිනය / திகதி / Date 2018 සැප්තැම්බර් 18 දින

සභාපති

ශ්‍රී ලංකා කපු සංස්ථාව

ශ්‍රී ලංකා කපු සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා කපු සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රමිතයෙහි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු.20,623,892 ක් වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රමිතයේ 74 වගන්තිය ප්‍රකාරව ණය සඳහා ඇපසුරුකුමක් ලෙස තබන ලද දේපළ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ රු.10,000,000 ක ණය මුදලක් ලබා ගැනීම සඳහා ඇපසුරුකුමක් ලෙස තබන ලද පුත්තලමේ පිහිටි "චින්තකුඩරිප්පු වත්ත" පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මුළු ණයගැතියන්ගෙන් සියයට 3.53 ක් අඩමාණ ණය වෙන්කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හඳුනාගෙන තිබුණද වසර 05 ඉක්මවූ ණයගැතියන් සඳහා හානිකරන අලාභ හඳුනාගැනීම හෝ අඩමාණ ණය වෙන්කිරීම සංස්ථාව විසින් සිදුකර තිබුණි. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දිනට විවිධ ණයගැති ශේෂ තුළ ඇතුලත් වසර 5 ඉක්මවූ රු.10,426,696 ක ණයගැති ශේෂ 07 ක් සඳහා හානිකරන අලාභ හඳුනාගැනීම හෝ අඩමාණ ණය වෙන්කිරීම සිදුකර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිලාභ ආයු ගණනය කිරීමෙන් ලද රු.9,436,077 ක ආයු ගණන ලාභය සංචිත ලෙස පෙන්නුම් කිරීම වෙනුවට වර්ෂයේ ආදායමට එකතු කිරීම නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සංස්ථාවේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව අර්ධ ස්ථාවර ගොඩනැගිලි (Semi-Permanent Buildings) වර්ෂයකට සියයට 33 1/3 ක් ක්ෂය කළ යුතු වුවත් රු 537,670 ක වියදමක් දරා ඉදිකරන ලද තාවකාලික අලෙවි සැල වර්ෂයකට සියයට 3 ක් ක්ෂය කිරීම නිසා වර්ෂයේ ක්ෂය වීම රු. 163,075 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට එළවන්කුලම බීජ උද්‍යානය සහ කිරාන් සංචාරක බංගලාවේ ඉදිකිරීම්වලට අදාලව ඉංජිනේරුවරයාගේ සහතික කිරීම මත නිමවී ඇති වැඩ සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු එකතුව රු.4,934,221 ක් වූ මුදල මූල්‍ය ප්‍රකාශන වල කෙරීගෙන යන වැඩ ලෙස හා ගෙවිය යුතු වියදම් ලෙස දක්වා නොතිබුණි.

(ඈ) එළවන්කුලම බීජ උද්‍යානයේ ඉදිකිරීමට අදාලව සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත්කරුගෙන් අඩු කරන ලද රඳවුම් මුදල වූ රු. 109,440 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඉ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ මාසික කුලිය වූ රු. 375,000 ක මුදල ගෙවීමේදී රු.93,750 ක් තැන්පතු මුදලින් අඩුකර ගනු ලබන අතර 2016 සහ 2017 වර්ෂවල දෙසැම්බර් මාස දෙකෙහි එම අඩු කිරීම නොසලකා හැරීම නිසා ගෙවිය යුතු කුලී ගිණුමේ ශේෂය හා තැන්පතු ගිණුමේ ශේෂය රු. 187,500 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවල සැපයුම්කරුවන් විසින් සපයා, භාණ්ඩ ලැබීම් පත්‍ර නිකුත්කර තිබූ එකතුව රු.1,007,325 ක් වූ වායු සමීකරණ 04 ක් සහ පරිගණක 05 ක් වත්කම් හා ගෙවිය යුතු ගිණුම්වලට ගෙන නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ 03 ක දුණු සැකසීම, තිරිංග සැකසීම යනාදී අළුත්වැඩියා කටයුතු සඳහා දරන ලද රු. 1,016,765 ක් වියදම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට ප්‍රාග්ධනීත ගතකර තිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වී අලෙවි මණ්ඩලයට ගෙවිය යුතු වර්ෂ 5 ඉක්ම වූ රු. 3,500,000 ක ණය ශේෂය පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවිය යුතු රු.1,699,709 ක් වූ විගණන ගාස්තු තුල වසර 10 ක් ඉක්මවූ රු.499,805 ක ශේෂයක්ද ඇතුලත්ව වන නමුත් මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු නොකර අඛණ්ඩව ගිණුම් වල දක්වා තිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම
(අ) 1958 අංක 15 දරන අර්ථ සාධක අරමුදල් පනතේ 15 වගන්තිය හා 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 16(1) වගන්තිය	පනතේ විධිවිධාන ප්‍රකාරව දායක මුදල් ඊළඟ මාසයේ අවසාන දිනට පෙර අරමුදල වෙත ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයට හා පෙර වර්ෂවලට අදාලව අර්ථසාධක අරමුදලට සේවා සේවක දායකත්වය රු.242,873 ක් සහ සේවක භාරකාර අරමුදලේ දායකය රු.28,633 ක් 2017 දෙසැම්බර් 31 දිනටත් එම අරමුදල්වලට නොගෙවා අත රඳවාගෙන තිබුණි.
(ආ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත	පාරිතෝෂික දීමනාව දින 30 ක් ඇතුලත ගෙවිය යුතු වුවත් නිලධාරීන් තිදෙනෙකුට ප්‍රවර්තන වර්ෂය තුළ දින 13 සිට දින 47 දක්වා ප්‍රමාද වී එම දීමනාව ගෙවා තිබුණි.
(ඇ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත හා 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත	භාණ්ඩ සපයන හා භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන ආයතනයක් වන විටදී සහ කාර්තුවක පිරිවැටුම රු.මිලියන 3 කට වැඩි හෝ වාර්ෂික පිරිවැටුම රු.මිලියන 12 කට වැඩි වන විටදී එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු සඳහා ලියාපදිංචි විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ)	2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත	සංස්ථාව ආදායම් බදු බැඳියාවට යටත් සංස්ථාවක් වන නමුත් 2011/2012 සිට 2016/2017 දක්වා තක්සේරු වර්ෂ 6 කට අදාල ආදායම් බදු ප්‍රකාශන සකස් කර ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඉ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 07 කදී ලබා දුන් එකතුව රු.76,890 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම 2018 අප්‍රේල් 30 දින වන විටත් පියවා නොතිබුණි.
(ඊ)	2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.

2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

සංස්ථාව සතු නැදගමුව පිරි සැකසුම් මධ්‍යස්ථානයේ සේවකයන් වෙත ලබා දෙන ලද වර්ෂ 15 කට වඩා පැරණි රු.31,219 ක උත්සව අත්තිකාරම් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ වියදමට කපාහැර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.42,335,721 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.36,525,411 ක් වීමෙන් ඉකුත් වර්ෂය හා සැසදීමේදී සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.5,810,310 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. වාණිජ අංශයේ දල ලාභය රු.5,489,581 කින් අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී , 2013 වර්ෂයේ රු.9,344,801 ක්ව පැවති ශුද්ධ අලාභය උච්ඡාවචනය වෙමින් 2017 වර්ෂයේදී රු.42,335,721 ක් වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු. 73,423,693 ක් වූ ධන දායකත්වය උච්ඡාවචනය වෙමින් 2017 වර්ෂයේදී රු. 83,261,486 ක් වී තිබුණි.

3.2 විග්‍රහාත්මක සමාලෝචනය

	2017	2016
ජංගම අනුපාතය	1.39:1	3.20: 1
සාමාන්‍ය ණය පියවීමේ කාලය (දින)	127	86
දළ ලාභ අනුපාතය (සියයට)	21	28

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී ජංගම වත්කම් මගින් ජංගම වගකීම් ආවරණය කිරීමේ හැකියාව වාර 3.2 ක් වූ අතර 2017 වර්ෂයේදී එය වාර 1.39 දක්වා පහත වැටී තිබූ අතර සාමාන්‍ය ණය පියවීමේ කාලය දින 86 සිට දින 127 දක්වා වර්ධනය වී තිබුණි.

(ආ) දළ ලාභ අනුපාතය 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී සියයට 7 කින් පහත වැටී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී විකුණුම් පිරිවැය රු.11,535,029 කින් වැඩිවීම දල ලාභ අනුපාතය පහත වැටීමට හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

සංස්ථාව විසින් කජු වගාව ව්‍යාප්ත කිරීම හා ජාතික නිෂ්පාදනය ඉහල නැංවීමේ අරමුණින් 2000 වර්ෂයේ සිට දිවයින පුරා කජු වගා සහනාධාර වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ සඳහා 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වර්ෂ 3 කදී එකතුව රු.191,152,222 ක් වැයකර තිබුණි.

එම වැඩසටහන යටතේ පුත්තලම, කුරුණෑගල, අනුරාධපුර, වවුනියා හා මන්නාරම යන දිස්ත්‍රික්ක වල ගොවීන් වෙත 2014, 2015 හා 2016 වර්ෂවලදී කජුපැල එකතුව 304,640 ක් බෙදා දී තිබුණි. කෙසේ වුවද සංස්ථාවේ ලේඛනගත තොරතුරු අනුව 2017 වර්ෂයේදී නිරීක්ෂණය වී ඇත්තේ පැල 143,325 ක් පමණි. එනම් ප්‍රගතිය සියයට 5 ක අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් හා නොවැම්බර් මාසවලට අදාලව සංස්ථාවේ සේවක සුභසාධක සංගමයේ දායක මුදල් ලෙස එකතුව රු. 886,840 ක් නිලධාරීන්ගේ වැටුපෙන් අයකරගෙන තිබුණද 2017 දෙසැම්බර් 31 දිනටත් සංගමය වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1982 අංක 03 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව ජීවන වියදම් දීමනාව සැලකිල්ලට ගෙන දායක මුදල් ගණනය නොකිරීම නිසා 2006 ජනවාරි සිට 2013 ජූලි දක්වා කාලයට අදාලව සමාලෝචිත වර්ෂයේදී රු. 1,138,508 ක අධිභාරයක් ගෙවීමට සිදු වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.569,253 ක් ගෙවා තිබුණි.

4.3 වත්කම් පාලනය

හිටපු සභාපතිවරුන් වෙත ලබා දී තිබුණු වටිනාකම රු. 148,135 ක් වූ ජංගම දුරකතන 07 ක් නැවත සංස්ථාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

අයිතිය සංස්ථාව සතු නොවූ වීරවිල පිහිටි ඉඩමක ප්‍රාදේශීය කාර්යාලයක් ඉදිකිරීම සඳහා රු.49,680 ක වියදමින් 2017 ඔක්තෝබර් 11 දින ලංසු කැඳවීමේ දැන්වීමක් පළකර තිබුණද, පසුව එහි ඉදිකිරීම් කටයුතු අත්හැර දැමීම නිසා එම වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා කප්පු සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. එසේ දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

6.1. ප්‍රසම්පාදනයන්

මඩකලපුව කිරාන්හි සංචාරක බංගලාවේ භාවිතය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.490,950 ක ගෘහභාණ්ඩ සහ රු.410,000 ක වායු සමීකරණ යන්ත්‍ර 04 ක් මිලදීගෙන තිබුණද එම මිලදී ගැනීම් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුල ඇතුලත්ව නොතිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ගිණුම්කරණය	(i) ඇතැම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම. (ii) ලෙජරය සඳහා ජ'නල් සටහන් ඇතුලත් කිරීමේදී මූල්‍ය බලතල පැවරී ඇති නිලධාරීන්ගේ අනුමැතිය ලබා නොගැනීම. (iii) ජ'නල් සටහන් යෙදීමේදී ඊට අදාල උපකාරක ලියවිලි අමුණා නොතිබීම
(ආ) වත්කම් පාලනය	(i) වාහන වල ඉන්ධන පරීක්ෂා කර සටහන් කර නොගැනීම. (ii) වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා නොගැනීම.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

<u>ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාරව නිකුත්කර ඇති විගණකාධිපති වාර්තාවේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් සංස්ථා පාර්ශවයෙන් අදහස් දැක්වීම් හා ගනු ලබන ක්‍රියාමාර්ග</u>

2.2.1 (අ) මෙහි සඳහන් සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර එම ප්‍රත්‍යාගණන ප්‍රතිඵල ගිණුම්පොත්වලට ඇතුලත් කළ යුතු නමුත්, අදාල වත්කම්වල ප්‍රත්‍යාගණන කටයුතු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම සම්බන්ධයෙන් ගැටළුසහගත තත්ත්වයක් පවතින හෙයින් එම කටයුතු ප්‍රමාද වී ඇත. ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන ලද වහාම කාණ්ඩයෙන් කාණ්ඩයට එම වත්කම්වල ප්‍රත්‍යාගණන කටයුතු නිමකර අදාල ප්‍රතිඵල ගිණුම්පොත්වල දැක්වීමට කටයුතු කරනු ඇත.

2.2.1. (ආ) මේ හා සම්බන්ධ අනාවරණය කිරීම් අදාල පරිදි ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවලට ඇතුලත් කරනු ලැබේ.

2.2.2. මෙහි සඳහන් සියලුම ණයගැති ශේෂ රජයේ ආයතනවලින් මෙම සංස්ථාව වෙත අයකරවා ගැනීමට පවතින ණය ශේෂයන් වේ. නිසි පරිදි උපදෙස් ලබා ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය යටතේ ප්‍රවර්තන වර්ෂය තුලදී මෙම ණයගැති ශේෂ සඳහා අඩමාණ ණය සඳහා වෙන්කිරීමක්/හානිකරන අලාභ සඳහා වෙන්කිරීමක් ගිණුම්පොත්වලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ඇත.

2.2.3 (අ) මෙය නිරූපනය කර දැක්වීමේ දෝෂයක් (**Presentation Error**) පමණක් වන අතර එමගින් මූල්‍ය ප්‍රකාශවලින් පෙන්නුම් කරන අවසාන මූල්‍ය ප්‍රතිඵලයට කිසිදු බලපෑමක් එල්ල නොවේ. එසේම මෙම දෝෂය පැවතිය ද විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මුළු විස්තීර්ණ ආදායම නිවැරදිව නිරූපනය වේ.

2.2.3 (ආ) මෙම ක්ෂය ඇස්තමේන්තු වෙනස්වීම් හා සම්බන්ධ නිවැරදිකිරීම් ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල සිදුකරනු ඇත.

2.2.3 (ඇ) මෙම ඉදිකිරීම් කටයුතු සඳහා සංස්ථාව මඟින් පත්කරගත් උපදේශන ආයතනය වූ ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ ප්‍රධාන ගෘහ නිර්මාණ ශිල්පී විසින් කිරාන් හි ඉදිකළ සංචාරක බංගලාවේ 2017.12.29 වන දිනට නිමකරන ලද වැඩවලට වටිනාකම සම්බන්ධයෙන් නිර්දේශයක් ඉදිරිපත් කර තිබුනේ තවදුරටත් සම්පූර්ණ කළයුතු වැඩ කොටස් කිහිපයකට යටත්වයි.

එම වැඩ කොටස් කිහිපය ද නිමකළ පසු සියලූ වැඩ අවසන් බවට අදාල ප්‍රධාන ගෘහ නිර්මාණ ශිල්පියා විසින් 2018.03.14 දිනැති ලිපියක් මඟින් මෙම සංස්ථාව වෙත දන්වා ඇත. ඒ අනුව ප්‍රවර්තන වර්යේ එනම් 2018 වර්ෂයේදී මෙම ඉදිකිරීම් වටිනාකම ප්‍රාග්ධනිත කර ඇත.

2.2.3 (ඈ) මෙම කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකමෙන් රැඳවුම් මුදල හැර අනෙකුත් සියලූ ගෙවීම් 2018.05.10 දින වනවිට ගෙවා අවසන් කර ඇත. ඒ අනුව රැඳවුම් මුදල නිදහස් කරන තෙක් එය වගකීමක් ලෙස ගිණුම් පොත්වලට සම්බන්ධ කර ඇත්තේ 2018 වර්ෂය සඳහා වේ.

2.2.3 (ඉ) මුල්‍ය ප්‍රකාශන අනුව පවතින ගොඩනැගිලි කුලිය වන රු. 468,750/- ක අගය හා සංසන්දනය කළ යුත්තේ රු. 281,250/- ක වටිනාකම නොව රු. 375,000/- ක අගයයි. එවිට ගොඩනැගිලි කුලී වියදම වැඩියෙන් පෙන්නුම්කර ඇත්තේ රු. 93,750/- ක අගයකින් වන අතර, එය ප්‍රවර්තන වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

ඉහත සඳහන් දෝෂය හේතුකොටගෙන කුලී තැන්පතු ගිණුමේ ශේෂය ද වැඩියෙන් දක්වා ඇත්තේ රු. 187,500/- කින් නොව රු. 93,750/- කින් වන අතර, ගොඩනැගිලි කුලී ගිණුම නිවැරදි කිරීමේදී මෙම තැන්පතු ශේෂයේ පවතින දෝෂය ද නිවැරදි වේ.

2.2.3 (ඊ) මෙහි සඳහන් වායු සමීකරණ යන්ත්‍ර හා පරිගණක යන්ත්‍ර මිලට ගැනීමේ වටිනාකම් වන පිළිවෙලින් රු. 410,000/-ක හා රු. 597,325/- ක අගයන්

සඳහා භාණ්ඩ ලැබීම්පත්‍ර යොදා සමාලෝචිත වර්ෂය තුලදී එම වත්කම් සංස්ථාවේ භාරයට ගෙන තිබුන ද, එම වත්කම් සැබෑ ලෙසම භාවිතයට ගැනීම ආරම්භ කරන ලද්දේ ප්‍රවර්තන වර්ෂය තුලදී වන බැවින් ඒවා ප්‍රවර්තන වර්ෂයේදී ගිණුම්පොත්වල ප්‍රාග්ධනිත කර ඇත.

2.2.3 (උ) මේ යටතේ සඳහන් සියලුම අළුත්වැඩියා වියදම් අදාල මෝටර් වාහනවල ඵලදායී ජීවිත කාලය ඉදිරි වර්ෂ 05 කට වඩා වැඩි කාලසීමාවකින් ඉහළ නැංවීමට හේතුවී ඇති බැවින් එම වියදම් සියල්ල ප්‍රාග්ධනිත කර ඇත.

2.3 (අ) වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතු මෙම ණය මුදල දීර්ඝ කාලයක් පුරා ගිණුම් පොත්වල ඉදිරියට ගෙන ශේෂයක් වන බැවින් එම ණය මුදල ගිණුම් පොත්වලින් කපා හැරීමට පවතින හැකියාව සම්බන්ධයෙන් වී අලෙවි මණ්ඩලය සමඟ සාකච්ඡා කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

2.3 (ආ) ප්‍රමාණවත් මුල්‍ය ප්‍රතිපාදන නොමැතිවීම හේතුකොටගෙන මෙම ගෙවිය යුතු විගණන ගාස්තු වටිනාකම ගෙවීම ප්‍රමාද වී ඇති අතර, ප්‍රවර්තන වර්ෂය තුලදී ලැබෙන ප්‍රතිපාදනවලට අනුව මෙම වගකීම කොටස් වශයෙන් හෝ ගෙවා නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

2.4 (අ) මෙහි සඳහන් රු. 242,873/- ක සේවක අර්ථසාධක අරමුදල් සහ රු. 28,633/-ක සේවක භාරකාර අරමුදල් වටිනාකම්, අදාල සේවකයන්ට මෙතෙක් සේ.අ.අ. හා සේ.භා.අ. අංක නිකුත් කර නොමැතිවීම හේතුකොටගෙන ප්‍රමාද වී ඇති ගෙවීම් වේ. අදාල ලේඛනමය තහවුරු කිරීම් ලද වහාම එම වගකීම් ගෙවා නිම කිරීමට කටයුතු කරනු ලැබේ.

2.4 (ආ) 2017 වර්ෂය සඳහා මෙම සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සේවක වැටුප් හා ඒ හා සම්බන්ධ ගෙවීම් සඳහා අනුමත කර මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කරන ලද පුනරාවර්තන ප්‍රදාන වටිනාකම රු. මිලියන 109.7 ක් වු අතර, කෙසේ නමුත් එම වටිනාකමෙන් භාණ්ඩාගාරය මඟින් මෙම සංස්ථාව වෙත අනුමත කරන ලද්දේ රු. මිලියන 54 ක් පමණි. ඒ අනුව 2017 වර්ෂය තුලදී සංස්ථා කාර්ය මණ්ඩල

සාමාජිකයන් වෙත වැටුප් හා අනෙකුත් ගෙවීම් සඳහා උපයාගත් අරමුදල්වලින් භාවිතා කරන ලද වටිනාකම රු. මිලියන 55.7 ක දැරිය නොහැකි අගයකි. මීට අතිරේකව වෙනත් පුනරාවර්තන වියදම් සඳහා ද තවත් රු. මිලියන 26.3 ක් සංස්ථාවේ උපයාගත් අරමුදල්වලින් යෙදවීමට සිදුවූ බැවින් 2017 වර්ෂය සංස්ථාවට දැඩි මූල්‍ය දුෂ්කරතා අත්විඳීමට සිදුවූ වර්ෂයක් විය.

ඉහත සඳහන් කරන ලද තත්ත්වය මත මෙම විගණන ඡේදයේ සඳහන් පරිදි කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ පාරිතෝෂික ගෙවීම් නිදහස් කිරීමේදී ප්‍රමාදයක් සිදුවිය.

2.4 (ඈ) මෙහි සඳහන් එකතුකළ වටිනාකම් මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු කජු නිෂ්පාදනවල විකුණුම් මිලට එකතු කිරීම හරහා ඉහළ යන මිල මත සංස්ථාවේ කජු සඳහා පවතින වෙළෙඳපොල ඉල්ලුම සම්බන්ධයෙන් නිර්මාණය විය හැකි විවිධ අහිතකර බලපෑම් සම්බන්ධයෙන් ද, විශේෂයෙන්ම මෙම කජු නිෂ්පාදන කෘෂිකාර්මික නිෂ්පාදන යටතට ගැනෙන බැවින් ඒ සම්බන්ධයෙන් ද විශේෂ අවධානය යොමු කරමින් විශේෂ බදු සහනයක් ලබාගැනීම පිණිස රේඛීය අමාත්‍යාංශය හරහා මුදල් අමාත්‍යාංශය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.මේ සඳහා ලැබෙන ප්‍රතිචාර මත ඉදිරි කටයුතු සිදුකිරීමට තීරණය කර ඇත.

2.4 (ඇ) මෙම ආදායම් බදු බැඳියාව සම්බන්ධයෙන් අදාල බදු උපදේශන ආයතනය සමඟ සාකච්ඡා කළ අතර, ඔවුන්ගේ මූලික ගණනය කිරීම්වලට අනුව, මෙහි සඳහන් වර්ෂයන්ට අදාලව බද්දට යටත් ලාභයක් සංස්ථාව මඟින් උපයා නොමැති බවට තහවුරු වී ඇත. ඒ අනුව අදාල ආදායම් බදු ප්‍රකාශන සකස් කිරීමේ කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

2.4 (ඉ) මෙහි සඳහන් වී ඇති රු.76,890/- ක මුළු අත්තිකාරම් අගයෙන් රු. 10,000/- ක අත්තිකාරම් මුදලක් හැර ඉතිරි සියලුම අත්තිකාරම් මුදල් ඒවා ලබාගෙන ඇති පුද්ගලයන් විසින් පියවා ඇති අතර, අදාල

පුද්ගලයන් විසින් සේවය කරන අංශ මඟින් පවත්වාගෙන යන අත්තිකාරම් රෙජිස්තරයන් හි එම පියවීම් නිසියාකාරව සටහන් කර ඇත. අදාල පියවීම් පිළිබඳ සටහන් මූල්‍ය අංශය මඟින් පවත්වාගෙන යන ප්‍රධාන අත්තිකාරම් රෙජිස්තරයට ඇතුලත් කරනු ලබන්නේ නියමිත පරිදි ජ'නල් වවුචර පිළියෙල කිරීමෙන් අනතුරුවයි. ඒ අනුව මේ වනවිට අදාල ජ'නල් වවුචර පිළියෙල කර අත්තිකාරම් පියවීම්වලට සම්බන්ධ සටහන් නියමිත පරිදි සම්පූර්ණ කර ඇත.

එසේම මෙතෙක් පියවා නොමැති රු. 10000/- ක අත්තිකාරම් මුදල, මූලික විනය පරීක්ෂණයට භාජනය වී වැඩ තහනම් වී විධිමත් විනය පරීක්ෂණයකට අනුව විනය දඬුවමකට පාත්‍ර වූ නිලධාරියෙකු විසින් ලබාගත් අත්තිකාරම් මුදලකි.

මෙම නිලධාරියා සංස්ථාවට එරෙහිව නඩු පවරා තිබූ බැවින් ද, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනය වනවිට එම නඩුවේ තීරණයක් ලබාදී නොතිබූ බැවින් ද අදාල අත්තිකාරම් මුදල පියවීමේ කටයුතු සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී ඇත.

2.4 (ඊ) ප්‍රවර්තන වර්ෂයේ සිට මේ අනුව කටයුතු කරනු ඇත.

2.5 මෙහි සඳහන් කපාහළ 31,219/- ක ණයගැති ශේෂය වසර 15 කට වඩා පැරණි දිගින් දිගටම ගිණුම් පොත්වල ඉදිරියට ගෙන එන ශේෂයකි. මේ සඳහා අදාල අනුමැතිය භාණ්ඩාගාරයෙන් ලබාගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.

4.1.1 වර්තමානයේදී කපු වගාවට යෝග්‍ය යැයි සැලකෙන වියළි කාලගුණයක් සහිත දිස්ත්‍රික්ක 19 ක සංස්ථාවේ කපු වගා සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. පසුගිය වසර ගණනාවක් තුල මෙම සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කළ නමුත් වගාවන් හි ඉතිරි කපු පැළ ගණන අනුව අදාල වැඩසටහනෙහි සාර්ථකත්වය සමස්තයක් වශයෙන් ගත්කළ

35%-40% කට ආසන්න වේ. සහනාධාර වැඩසටහනෙහි සාර්ථකත්වය අඩුවීම කෙරෙහි පහත හේතු සෘජුවම බලපා ඇත.

1. නියඟය හේතුකොටගෙන අධිකව කජු පැළ මියයාමකට ලක්වීම හා කජු පැළවලට යෙදීම සඳහා ජලය සපයා ගැනීමේ දුෂ්කරතාවය.

2. ප්‍රමාණයෙන් කුඩා ඉඩම්වලට (එනම් අක්කර 1/2 ක වපසරියක් සහිත ඉඩම්වල සිට) සහනාධාර වැඩසටහන යටතේ කජු පැළ ලබාදීම හේතුවෙන් සහනාධාර ප්‍රතිලාභීන්ගේ උනන්දුව හීනවීම මත කල්යත්ම ඔවුන් විසින් වගාව නොසලකා හැරීම.

3. වගාව කෙරෙහි අහිතකර ලෙස බලපාන අයහපත් කාලගුණික හා පාරිසරික හේතූන්.

4. වනසතුන්ගෙන් වගාවට සිදුවන හානි.

5. අනපේක්ෂිත ගිනි හානි.

6. කජු අස්වනු ලැබීමට දීර්ඝ කාලයක් ගතවීම හේතුවෙන් කල්යත්ම සහනාධාර ප්‍රතිලාභීන්ගේ උනන්දු හීනවී කජු වගාව අතහැර දමා වෙනත් කෙටිකාලීනව අස්වනු ලැබෙන භෝග වගාවන්ට යොමුවීම.

7. වෙනත් භෝග වගාවන් සඳහා වඩා ආකර්ශනීය සහනාධාර ප්‍රතිලාභ හිමිවන හෙයින් කල්යත්ම කජු වගාව අතහැර දමා එම වැඩි සහනාධාර ප්‍රතිලාභ ලැබෙන වගාවන් සඳහා සහනාධාර ප්‍රතිලාභීන් යොමුවීම.

8. සහනාධාර ප්‍රතිලාභීන්ට පෞද්ගලික වශයෙන් බලපා ඇති වෙනත් හේතු,

ඉහත තත්ත්වය පිළිබඳව දීර්ඝ වශයෙන් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව සමාලෝචිත වර්ෂයේ සිට (එනම් 2017 වර්ෂයේ සිට) ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන ස්ථාන/භූමි සඳහා මූලිකත්වය ලබාදී කප්‍රු වගා සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට 2017.03.31 දින පැවති සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී.

1. ත්‍රිවිධ හමුදාවේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කඳවුරු පරිශ්‍රයන් ආශ්‍රිතව පවතින කප්‍රු වගාවට සුදුසු භූමි.

2. එළිමහන් සිර කඳවුරු ආශ්‍රිතව පවතින කප්‍රු වගාවට සුදුසු භූමි.

3. බෞද්ධ පන්සල්, කතෝලික දේවස්ථාන, හින්දු කෝවිල් සහ ඉස්ලාම් දේවස්ථාන සතුව පවතින කප්‍රු වගාවට සුදුසු භූමි.

4. රජයේ පාසැල් ආශ්‍රිතව පවතින කප්‍රු වගාවට සුදුසු භූමි.

මෙම ක්‍රමවේදය භාවිතා කිරීම තුලින් කප්‍රු වගාවේ පැවැත්ම සහ වර්ධනය සඳහා අවශ්‍ය භෞතික සම්පත් මෙන්ම මානව සම්පත් ද ප්‍රමාණවත් පරිදි සපයා ගැනීමේ හැකියාව පවතී.

එසේම නව ගෙවතු වගා ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ගෙවතු සඳහා ද , නිවාස අධිකාරිය මඟින් සිදුකරන නව නිවාස ව්‍යාපෘතීන්වල නිවාස ලාභීන්ගේ ගෙවතු සඳහා ද කප්‍රු පැළ නිකුත් කිරීම මේ සමඟ ක්‍රියාත්මක වේ.

2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද ඉහත භූමිවල සිදුකරන ලද කප්‍රු වගාවන් හි සාර්ථකත්වය සම්බන්ධයෙන් මේ වනවිට අදාල පරීක්ෂාකිරීමේ/ඇගයීමේ කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

4.2 (අ) මීට පෙර 2.4 (ආ) යටතේ සඳහන් කළ පරිදි 2017 වර්ෂයේදී පැවති දැඩි මුල්‍ය දුෂ්කරතා හේතුකොටගෙන මෙම සුභසාධක සංගම් දායක මුදල් එම සංගමය වෙත ගෙවීම ප්‍රමාද වූ අතර, මේ වනවිට එම සියලු දායක මුදල් ගෙවා අවසන් කර ඇත.

4.2 (ආ) මෙහි සඳහන් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් වටිනාකම, කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ වැටුපෙහි අන්තර්ගත ජීවන වියදම් දීමනාව සඳහා සේ.නි.භා. දායකය ගණනය කරනු ලබන්නේ ද, නොලබන්නේ ද යන්න නිවැරදිව අර්ථ දක්වා නොතිබීම හේතුකොටගෙන ගණනය නොකළ වටිනාකමකි. මෙහි සඳහන් රු. 1,138,508/- ක සමස්ත ශේෂය අදාල දිනට දායක මුදල ද ඇතුළු සමස්ත වගකීම වන අතර, ඒ තුල අන්තර්ගත අධිභාරය රු. 569,253/-ක් පමණි.එම වගකීම මේ වනවිට සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කර ඇත.

4.3 මෙහි සඳහන් සියලු වත්කම් භාවිතයෙන් බැහැර ඒවා වේ.ඒවා අපහරණය සඳහා යොමු කර ඇත.

4.4 මුලික වශයෙන් මෙහි සඳහන් ඉඩමෙන් අක්කර 10 ක ප්‍රමාණයක් වීරවිල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ලිඛිතව මෙම සංස්ථාව වෙත පවරා තිබූ බැවින් ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් ගැටළුසහගත තත්ත්වයක් නොතිබූ නිසා අදාල ඉඩමේ අප ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීම සඳහා අවශ්‍ය මුලික කටයුතු ආරම්භ කිරීම සඳහා ප්‍රසම්පාදන මඟපෙන්වීම් ප්‍රකාරව ජාතික පුවත්පතක දැන්වීමක් පළකරන ලදී.

ඉහත පුවත්පත් දැන්වීම පළකිරීමෙන් පසු මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් හම්බන්තොට දිසත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රධාන නගර සැලැස්මට ඉහත සඳහන් වීරවිල ඉඩම අයත් වී ඇති බව අනාවරණය වූ අතර, ප්‍රදේශයේ ඉඩම්වල මිල ගණන්වලට අනුව මෙය ඉතා ඉහළ වටිනාකමකින් යුක්ත ඉඩමක් වන හෙයින් ඉන් අක්කර 10 ක ප්‍රමාණයක් මෙම සංස්ථාව වෙත පැවරීමට

නොහැකි බව නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැනුම්දෙන ලදී. ඒ අනුව එම ඉඩමෙන් අක්කර 01 ක ප්‍රමාණයක් පමණක් මෙම සංස්ථාව වෙත ලබාදීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකඟතාවය පළකර ඇති අතර, එම ඉඩම් කොටසේ අයිතිය සංස්ථාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

5.1 මේ සම්බන්ධයෙන් අදාල උපදෙස් රේඛීය අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කර ඇති අතර, එම උපදෙස්වලට අනුව ඉදිරි කාලයේදී අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත.

6.1 මෙහි සඳහන් ගෘහ භාණ්ඩ හා වායු සමීකරණ මිලදී ගැනීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ද 2017 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම තුල කිරාන් හි පිහිටි ගොඩනැගිල්ලේ නවීකරණය සම්බන්ධයෙන් වන මුලු පිරිවැය තුල ඇතුලත් වී ඇත.

7. මෙහි සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ඒවාට අදාල විගණන විමසුම්වලදී වෙන වෙනම පිළිතුරු ඉදිරිපත් කර ඇති අතර, කෙසේ නමුත් ඉදිරියේදී මෙම පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර කටයුතු කිරීමට සටහන් කරගන්නා ලදී.

ශ්‍රී ලංකා කජු සංස්ථාව

වර්ෂ 05 ක ගිණුම් සාරාංශය

ලාභාලාභ ගිණුම	2017 රු.	2016 රු.	2015 රු.	2014 රු.	2013 රු.
ශුද්ධ විකුණුම්	100,951	94,906	75,297	115,370	134,180
විකුණුම් පිරිවැය	(80,182)	(68,648)	(55,055)	(62,376)	(82,586)
දළ ලාභය	**20,76**	**26,258**	**20,242**	**52,994**	**51,594**
අනෙකුත් ආදායම්	15,522	28,224	13,974	4,219	10,494
පුනරාවර්තන ප්‍රදාන	18,700	16,923	27,798	21,235	22,775
පරිපාලන වියදම්	(38,893)	(39,141)	(44,001)	(53,396)	(43,493)
ක්‍රමක්ෂය	244	(634)	(992)	(3,283)	(3,045)
වාණිජ කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය	**16,342**	**31,630**	**17,021**	**21,769**	**38,325**
සේවා අංශය- ආදායම් ඉක්මවූ වියදම්	**(58,678)**	**(68,155)**	**(64,749)**	**(47,826)**	**(37,358)**
ශුද්ධ ලාභය/අලාභය	**(42,336)**	**(36,525)**	**(47,728)**	**(26,057)**	**967**
ශේෂ පත්‍රය					
ජංගම නොවන වත්කම්					
දේපල පිරියත සහ උපකරණ	89,363	100,869	110,208	77,005	63,916
ඵල දරණ වගා නඩත්තුව	22,870	29,303	31,442	35,141	30,466
පර්යේෂණ සහ සංවර්ධන වියදම්	-	-	-	1,046	215
ඵල නොදරණ වගා නඩත්තුව	50,446	41,362	33,243	25,853	29,288
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ	1,726	-	-	-	-
අනෙකුත් කුඩා ව්‍යාපෘති	620	949	806	615	619
මුළු ජංගම නොවන වත්කම්	**165,025**	**172,483**	**175,699**	**139,660**	**124,504**
ජංගම වත්කම්					
තොග	24,940	28,916	30,131	48,712	29,460
වෙළඳ ණය ගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ	19,597	20,798	24,411	24,843	60,042
අත්තිකාරම් සහ පූර්ව ගෙවීම්	3,810	4,841	4,287	10,080	5,461
මුදල් හා මුදල් සමාන දෑ	5,806	7,874	38,846	60,879	66,529
මුළු ජංගම වත්කම්	**54,153**	**62,429**	**97,675**	**144,514**	**161,492**
මුළු වත්කම්	**219,178**	**234,912**	**273,374**	**284,174**	**285,996**
හිමිකම් සහ වගකීම්					
හිමිකම්					
මූලික ප්‍රාග්ධනය	40,000	40,000	40,000	40,000	40,000
රාජ්‍ය ප්‍රදාන	143,996	123,860	114,881	78,957	58,745
අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන	18,143	18,530	18,917	19,304	19,691
ප්‍රාග්ධන සංචිත	17,442	17,442	17,442	22,215	22,241
ලාභාලාභ ගිණුම	(70,311)	(27,975)	8,550	56,278	81,339
මුළු හිමිකම්	**149,270**	**171,857**	**199,790**	**216,754**	**222,016**
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂිත දීමනා සඳහා වෙන් කිරීම්	27,335	40,060	52,471	42,415	33,875
වාහන කල්බදු	-	-	-	-	3,257
දිගු කාලීන ණය	3,500	-	-	-	-
මුළු ජංගම නොවන වගකීම්	**30,835**	**40,060**	**52,471**	**42,415**	**37,132**
ජංගම වගකීම්					
වෙළඳ ණය හිමියෝ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	39,073	22,995	21,113	25,005	26,849
මුළු ජංගම වගකීම්	**39,073**	**22,995**	**21,113**	**25,005**	**26,849**
මුළු ස්කන්ධ සහ වගකීම්	**219,178**	**234,912**	**273,374**	**284,174**	**285,997**
ශුද්ධ වත්කම් ප්‍රතිලාභය %	(28.3)	(21.3)	(23.9)	(12.0)	0.44
ශුද්ධ ලාභ අනුපාතය %	(41.9)	(38.5)	(63.4)	(22.6)	0.7
ජංගම අනුපාතය	1.4	2.7	4.6	5.8	6.0
ක්ෂණික වත්කම් අනුපාතය	(1.3)	1.5	3.2	3.8	4.9
මුළු ආදායමට මුළු වියදම	0.8	0.1	0.8	0.9	1.0